# නියමුවා

"ජයග්‍රහණ අත්පත් කර ගැනීම සඳහා, කම්කරුවන් හා දුප්පත් ගොවි ජනතාව බලය අල්ලාගනු දැකීම සඳහා, එම බලය රැකගනිමින් එයින් නිසි ප්‍රයෝජන ගනු සඳහා ඔබට සංවිධානය, නැවතත් සංවිධානය තව තවත් සංවිධානය අවශ්‍ය වනු ඇත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05වැනි වෙළුම,**
**141 පිටුව**

ISSN 1391 - 1031 | 2020 නොවැම්බර්, ඉලෙක්ට්‍රෝනික සංස්කරණය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී




2020.10.27 එක්සත් ජනපද තානාපති කාර්යාලය ඉදිරිපිට

# ශ්‍රී ලංකාව කිසිදු යුද සංවිධානයක කොටස්කරුවෙකු නොකළ යුතුයි

# ජ.වි.පෙ. ආණ්ඩුවට අවධාරණය කරයි

රටේ අපනයන ආදායම ආනයන වියදමෙන් අඩක් හෝ සපුරාගැනීමට අසමත් වී ඇති බවත් පාලකයන් විසින් රට ආර්ථිකමය වශයෙන් දුබල කර රු. ට්‍රිලියන 14ක විශාල ණය උගුලක හිරකර ඇති බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, මෙම තත්වය තුළ බලගතු රාජ්‍යයන් විසින් රටේ ස්වාධීනත්වය හා ස්වෛරීත්වය පා පන්දුවක් බවට පත්කරගෙන තිබෙන බවත් ඔවුන්ගේ වුවමනාකම් අනුව රට කිසිදු යුද සංවිධානයක කොටස්කරුවෙකු නොකිරීමට ආණ්ඩුව වගබලා ගත යුතුව ඇති බවත් අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මෙසේ ප්‍රකාශ කළේ, එ.ජ. රාජ්‍ය ලේකම්වරයාගේ ශ්‍රී ලංකා සංචාරය පිළිබඳව පසුගිය 28වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජනමාධ්‍ය සාකච්ඡාවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"චීනය, ඉන්දියාව, එක්සත් ජනපදය වැනි ලෝක බලවතුන් හමුවේ ශ්‍රී ලංකාව අසරණභාවයට පත්කර තිබෙනවා. අපේ දේශපාලන අධිකාරිය කොමිස් කප්පම්වලට අත්පත්කරගෙන තිබෙනවා. ඒ මගින් රටට කිසිදු ප්‍රතිඵලදායක නැති විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් සඳහා ණය ගනිමින් උගුලක හිරකරනු ලැබුවා. මේ විදිහට ලෝක බලවතුන්ගේ ක්‍රීඩා පිටියක් බවට ශ්‍රී ලංකාව පත්කර තිබෙනවා. මයික් පොම්පියෝ රාජ්‍ය ලේකම්වරයා පැමිණීමට පෙර ඔහුගේ සහයක නිලධාරීන් වන ඩීල් තොම්සන් සහ ඩේවිඩ් ස්ටීල්වෙල් ප්‍රකාශ කර තිබූ පරිදි එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකාවට ලබාදී තිබූ යෝජනාවලිය අනුව ඉදිරියේදී අප ගමන් කරන්නේ කවුරුන් සමගද යන්න තීරණය කළ යුතු බවට කර තිබෙන බලපෑම ගැන රටට හෙළිදරව් කළ යුතුයි.

මෙය මැදමුලන පොල් වත්ත පිළිබඳව ප්‍රශ්නයක් නෙවෙයි. රාජ්‍ය ලේකම්වරයා මේ නැදෑ ගමනක් පැමිණීමක්ද නෙමෙයි. ඉතා පැහැදිලිව ඉන්දියානු සාගරයේ යුද ආධිපත්‍යය තහවුරු කරගන්න ඔවුන් විසින් ඉන්දියාව, ලංකාව, මාලදිවයින සහ ඉන්දුනීසියාව තෝරා ගෙන තිබෙනවා. රාජ්‍ය ලේකම්වරයාගේ මෙම ගමනේ අරමුණ ඉන්දියානු සාගරයේ යුද ආධිපත්‍යයේ කොටස්කරුවෙකු බවට, ඊට සහයෝගය දක්වන්නෙකු බවට ශ්‍රී ලංකාව පත්කර ගැනීමේ සැලැස්මක් ක්‍රියාවට නැගීමට මුල පිරීමයි. අපි ආණ්ඩුවට අනතුරු අඟවන්නේ කිසිදු ජාත්‍යන්තර යුද සංවිධානයක පංගුකරුවෙකු හෝ කොටස්කරුවෙකු බවට ශ්‍රී ලංකාව පත් නොකළ යුතු බවටයි.

ඒ වගේම මව්බිමට සැබෑ ලෙසම ප්‍රේම කරන ජනතාවගෙන් අපි ඉල්ලා සිටින්නේ, අවුරුදු 70ක් රට පාලනය කළ මේ දෙපිරිස විසින් ක්‍රමානුකූලව මේ රට ලෝක බලවතුන් හමුවේ හිර කිරීමට එරෙහිව පෙරට එන්න කියලයි. දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි ඊට නායකත්වය දී තිබෙනවා. ආණ්ඩුව වහාම ගෝඨාභය රාජපක්ෂ සහ මයික් පොම්පියෝ අතර සිදුකළ සාකච්ඡාවලදී එළඹුණු එකඟතාවයන් පිළිබඳ රටට හෙළිදරව් කළ යුතුයි. විදේශ අමාත්‍යවරයා සමග සිදුකළ සාකච්ඡාවලදී එළඹුණු එකඟතාවයන් සහ බැහැර කළ යෝජනා පිළිබඳව ප්‍රකාශ කළ යුතුයි. මේ සාකච්ඡා සිදුවෙමින් තිබෙන්නේ අපේ මාතෘභූමියේ අනාගතය පිළිබඳව නිසා මේ රටේ 07වැනි පිටුවට

## 02 ණය ගෙවීමට



20වැනි සංශෝධනයෙන් බලය තහවුරු කරගත්තද ආණ්ඩුවට හැරීමට ඇති තාවකාලික වුවත් එකම විකල්පය චීනය, ඉන්දියාව හා ඇමරිකා එක්සත් ජනපදය හමුවේ දණ ගැසීමය....

## 03 '20' සම්මතයි!...





උපරිම විධායක බලයද සහිත ගෝඨාභය ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුව ඉදිරියේ දැන් ඇත්තේ සුළුපටු අභියෝග නොවේ....

## 04 ඉල්මහේ නොමියන...



සැබෑ භෞතිකවාදී ඓතිහාසික පදනමක් මත පිහිටා ඉතිහාසය යළි ලියන දිනයක් නිසැකවම උදාවෙන බව අපි දනිමු. එදිනට ඉතිහාසය යළි ලියන්නේ ජයග්‍රාහී ජනතාවන් විසිනි....

## 05 සැබෑ දේශප්‍රේමීත්වය...



88-89 අරගලය 1818, 1848 අරගලවලටත් වඩා ඉදිරියෙන් තියෙන්නේ. 1818, 48 අරගල යටත්විජිත විරෝධී වුණාට එහි අරමුණ වුණේ රාජාණ්ඩුව යළි අතිකිරීමයි...

## 06 නව ලෝක බල තුලනය...



මෙම තත්වය චීනය හා එක්සත් ජනපදය අතර 'සීතල යුද්ධයක්' බවට පත්වනු ඇතැයි දේශපාලන විචාරකයන්ගේ අදහසය...

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# ණය ගෙවීමට ණය ගැනීම සඳහා දණ ගැසීම



ලංකාවේ ආර්ථික අර්බුදයේ ස්වරූපයය ගැන අප අවස්ථා ගණනාවකදීම විවිධ මානයන්ගෙන් සාකච්ඡා කර ඇත. යළි එම සාකච්ඡාව අලුත් කරන මාතෘකාවක් බවට පත්වී ඇත්තේ මෙතරම් ණය කන්දරාවක හිරවී සිටියදීත් ආණ්ඩුව පසුගිය ඔක්තෝබර් 04වැනිදාට කල්පිරුණු සෛවරීත්ව බැඳුම්කර ණයක් සඳහා ඩොලර් මිලියන 1000ක් (ඩොලර් බිලියනයක්) ගෙවීමත් සමගය.

මොන ආර්ථික අර්බුද තිබුණත් ආණ්ඩුවට තවමත් ණය ගෙවීමට ඩොලර් හැකියාව ඇතැයි මේ නිසා ආණ්ඩුවට කඩේ යන විචාරකයින් පම්පෝරි දෙසනුද දැකිය හැකිය. නමුත් සැබෑ යථාර්ථය එය නොවේ. ආණ්ඩුව පියවන ලද්දේ 2007 දී ගනු ලැබූ 2020දී කල් පිරෙන ඩොලර් බිලියනයකි. ඒ ගෙවීමට ආණ්ඩුවේ භාණ්ඩාගාරයට ඩොලර් තිබුණේ නැත. ආණ්ඩුවට කළ හැකි වූයේ මහ බැංකුවෙන් ඩොලර් ගෙන ණය පියවීමය. ඒ සඳහා ආණ්ඩුව වෙනුවෙන් භාණ්ඩාගාරය මහා බැංකුවට ඩොලර් බිලියනයට වටිනාකමට රුපියල් ගෙවිය යුතුය. නමුත් ආණ්ඩුවේ භාණ්ඩාගාරයට ගෙවීමට රුපියල්ද නොවීය. ඒ නිසා ආණ්ඩුව සිදු කළේ පසුව කල්පිරෙන පරිදි ඩොලර් බිලියනයක වටිනාකමට සරිලන රුපියල් බිලියන 190ක භාණ්ඩාගාර බිල්පත් මහ බැංකුවට දී ඩොලර් බිලියනයක් ලබා ගැනීමය. මහා බැංකුව එම රුපියල් බිලියන 190ට සමාන ලෙස මුදල් අච්චුගසා වෙළඳපොළට නිකුත් කළේය.

## උද්ධමනය

දැන් ආණ්ඩුවට ඩොලර් බිලියනයක් අපි ණය ගෙව්වා යැයි සතුටු විය හැකි නමුත්, එහි අතුරු ප්‍රතිඵල දෙකක් එකවර ආර්ථිකයට එල්ල වී ඇත. එකක් මහ බැංකුවේ මූල්‍ය සංචිතය ඩොලර් බිලියනයකින් අඩුවීමය. දෙවැන්න අනවශ්‍ය මුදල් ප්‍රමාණයකින් මුදල් වෙළඳපොළ කෘත්‍රිමව පිම්බීමය. නිෂ්පාදනයක් සිදු නොවී හුදු මුදල් සැපයුම ඉහළ යන නිසා එමගින් වෙළඳපොළේ පවතින භාණ්ඩ ප්‍රමාණයේ මිල මට්ටම සීඝ්‍ර ලෙස ඉහළ යාමට හේතුවේ. එය උද්ධමනකාරී වාතාවරණයක් හදයි. ආණ්ඩුව ඒ වාතාවරණය දැන් නිර්මාණය කරගෙන හමාරය.

## ණය - පඩි හා පොලී

මුදල් අමාත්‍යාංශ වාර්තා අනුව 2020දී ආණ්ඩුවේ ආදායම අපේක්ෂා කළාට වඩා රු. බිලියන 1891කින් එනම් රු. බිලියන 1450ට බසිනු ඇතැයි ගණනය කර ඇත. එය ලොව අඩුම ආදායම ලබන රටවල්වල මට්ටමට පහත වැටීමක් වනු ඇත. 2020 වසර මුලදී සිදු කළ ආදායම් බදු කපා හැරීමත්, කොවිඩ් 19 වසංගතයේ බලපෑමත් මෙයට හේතු වනු ඇත. රජයේ පුරෝකථනයන් අනුව රජයේ පුනරාවර්තන වියදම දැරීමටවත් මෙම ආදායම ප්‍රමාණවත් නොවනු ඇත. රජයේ සේවක වැටුප් සහ විශ්‍රාම වැටුප් ගෙවීමට පමණක් රු. මිලියන 978 ක් අවශ්‍ය වේ. එය මෙම අපේක්ෂිත ආදායමෙන් 67% කි. ණය හැර ණයවල පොලිය ගෙවීමට පමණක් තවත් රුපියල් මිලියන 857ක් අවශ්‍යය. එම දෙකේ (වැටුප්, විශ්‍රාම වැටුප්, හා ණය පොලී) එකතුව පමණක් ආණ්ඩුවේ ආදායමෙන් 127% කි. මීට අමතරව වාර්ෂිකව අනිවාර්ය ලෙසම දැරීමට සිදුවන සාමාන්‍ය වියදම ලෙස සමෘද්ධි දීමනා, පොහොර සහනාධාර ණය වාරික ගෙවීම ආදිය සැලකිල්ලට ලක්කල විට රජයේ වියදම රු මිලියන 2799 ක් වනු ඇතැයි ගණනයකර ඇත. නමුත්, ආදායම පුරෝකථනය කරනුයේ රු. බිලියන 1450ක් පමණි. ඒ නිසාම ආදායමට වැඩි වියදම ආසන්න ලෙසම රු. බිලියන 1349 කි. මේ තත්වය යටතේ රට තුළ ආර්ථිකයට සල්ලි අච්චු ගැසීම හැර ආණ්ඩුවට තාවකාලික වෙනත් උත්තර ඇත්තේ නැත.


## ඩොලර් සංචිතය හා රුපියල්

දැන් රටේ ඇත්තේ රුපියල්වලින් ගෙවා පියවිය හැකි ණය අර්බුදයක් නම් සල්ලි අච්චු ගැසීමෙන් හෝ නොගෙවා කල් දැමීමෙන් හෝ බැංකුවල ඇති දේශීය මුදල් සංචිත හුවමාරු කිරීමෙන් ඒ ප්‍රශ්නයට තාවකාලික උත්තරයක් සෙවිය හැකිය. නමුත් ආසන්න වශයෙන් මාසයකට ඩොලර් මිලියන 400ක් එනම් වසරකට ඩොලර් මිලියන 4800ක් විදේශ ණය වාරික ගෙවීමට ඩොලර් අවශ්‍යය. ඊට අමතරව 2021 ජූලි මාසයේදීද තවත් තවත් ඩොලර් බිලියනයක සෛවරීත්ව සංවර්ධන බැඳුම්කරයක් කල් පිරෙනු ඇත. ඒ අනුව ගෙවීමට ඇති විදෙස් ණය සඳහා අවශ්‍ය ඩොලර් ප්‍රමාණය ආසන්න ලෙස ඩොලර් මිලියන 5800කි. නමුත් පැවැති විදේශ සංචිත ඩොලර් ප්‍රමාණයෙන් ඔක්තෝබර් මුල ඩොලර් බිලියනය ගෙවූ පසු දැන් ආණ්ඩුව වෙනුවෙන් මහා බැංකුවේ ඉතිරිව ඇත්තේ ඩොලර් බිලියන 5.1ක් පමණි.

ඒ මුළු විදේශ සංචිතයයි. නමුත් ලබන වසර තුළ පමණක් ගෙවීමට ඇති ණය ප්‍රමාණය ආසන්න ලෙස ඩොලර් බිලියන 5.8කි. ඒ අනුව පිටස්තර විදේශ අත දීමක් (අත පෙවීමක්) මගින් විශාල ඩොලර් ණයක් නොලැබේ නම් රටක් ලෙස ගමන් කරනු ඇත්තේ දැවැන්ත ණය අර්බුදයකටය.

රටවල් මැදිහත්වී සිදුකරන ඉදිකිරීම් ව්‍යාපෘති මගින් රටට ගලාඑන විදේශ වත්කම් මේ පවතින අර්බුදයට පිළියමක් නොවන්නේ ඩොලර් මිලියන 1000ක් ආයෝජනය කරන්නේ නම් ඔවුන්ගේම කොන්දේසි අනුව එයින් 40%ක් පමණ එම රටවල රඳවා ගන්නා නිසාය. ඉතිරි 60%ද ඔවුන් යොදවන්නේ එකවර නොව අදාළ ව්‍යාපෘතියේ නියමිත අදියරයන්ටය. විදේශ විනිමය අර්බුදය ලංකාවට තවත් බරපතළ වන්නේ සංචාරක කර්මාන්තයේ මුළුමනින්ම සිදුව ඇති බිඳවැටීම සහ විදේශ රැකියා නියුක්තිකයින් මුදල් ලංකාවට එවීම නතරවීමේ ඇති ඉඩකඩ නිසාය.

2020 වර්ෂයේ ආණ්ඩුවේ ආදායම:
වැටුප් හා පොලී පුනරාවර්තන ගෙවීම් සඳහා ප්‍රමාණවත් නොවීම




දැන් මේ සියලු සාධක විසින් ආණ්ඩුවට ඉතිරි කරන විකල්ප වී ඇත්තේ අධිරාජ්‍යවාදීන් ඉදිරියේ ණය ගෙවීමට ණය ගැනීම සඳහා දණ ගැසීමය. අද චීනයේ සහ ඇමරිකන් එක්සත් ජනපද බලවතුන් ලංකාවට ලංසු කිරීමේ තරගයක යෙදී ඇත්තේ මේ නිසාය.

## පැන්ඩා සමුරායි වෙනුවට IMF

චීනයේ සංවර්ධන බැඳුම්කර වෙළඳපොළ හඳුන්වන්නේ පැන්ඩා වෙළඳපොළ ලෙසිනි. ජපානයේ එය සමුරායි වෙළඳපොළය. ඒවා රටක ආර්ථිකයේ ශක්තිය අනුව බැඳුම්කර විකිණීමෙන් ණය හෝ අවශ්‍ය ඩොලර් ලබාගත හැකි වාණිජ වෙළඳපොළවල්ය. නමුත් ලංකාව ණය ගෙවීමට ඇති හැකියාව අනුව දුර්වල අසාර්ථක මට්ටමට ශ්‍රේණිගත වී ඇති තත්වය යටතේ එම වෙළඳපොළ තුළ තරගකර බැඳුම්කර අලෙවි කළ නොහැකිය.

ඒ නිසාම 20වැනි සංශෝධනයෙන් බලය තහවුරු කරගත්තද ආණ්ඩුවට හැරීමට ඇති තාවකාලික වුවත් එකම විකල්පය චීනය, ඉන්දියාව හා ඇමරිකා එක්සත් ජනපදය හමුවේ දණ ගැසීමය. ඔවුනගේ ලෝක අපනයන වෙළඳපොළ අනුව සලකන විට එම රටවල් තුනටම ලංකාවේ වෙළඳපොළ අත්පත්කර ගැනීමේ ලොකු ආර්ථික වාසියක් නැත. එම රටවලට ඇත්තේ ලංකාවේ භූ දේශපාලන පිහිටීමේ වාසිය පමණි. චීනය ආසියා පැසිපික් කලාපීය ආර්ථික බලවතා වීමේදී ඉන්දියාවට, ජපානයට බලපෑම් කරන මර්මස්ථානයක අපගේ වරායන් පිහිටීම වැදගත්ය. චීනය දුබල කිරීමට බලපෑම් කිරීමේදී ඉන්දියාවට සහ එක්සත් ජනපදයට ලංකාවේ පිහිටීම අතිශය වැදගත් සාධකයකි. ඒ පිහිටීම සලකා ණය උගුලක් ඇටවීමෙන් අප මාතෘභූමිය දුබල කිරීම ඔවුන්ට ඉතා පහසුය. මන්ද ලංකාවේ බලය හොබවන්නේ ඒ ණය වෙනුවෙන් ඕනෑම පාවාදීමකට කැමැත්තෙන්ම ඉදිරිපත් වන පාලක කණ්ඩායමක් බැවිනි.

ආණ්ඩුවට තාවකාලිකව මුදල් අච්චු ගැසීම සඳහා මහ බැංකුවට බලපෑම් කර භාණ්ඩාගාර බිල්පත් නිකුත් කළ හැකිය. දැන් ඒ සඳහා ආණ්ඩුව මහ බැංකුවේ ස්වාධීනත්වය මුළුමනින්ම අවසන් කර ඇත. මහ බැංකුව කටයුතු කළ යුත්තේ ආණ්ඩුවක් ගොඩදැමීමට නොව රට අර්බුදයට පත්වීම වැළැක්වීමටය. මිල මට්ටම ඉහළයාමෙන් උද්ධමනයට වන බලපෑම පාලනයට රුපියලේ අගය බාල්දු නොවී පවත්වා ගෙන යාම වැනි කටයුතු මහ බැංකුවේ වගකීම වේ. නමුත් අද පී.බී. ජයසුන්දර - කබ්රාල් න්‍යාය අනුව මහ බැංකුවට ද සිදුව ඇත්තේ, රට අලගුවට තියා ආණ්ඩුවේ එදාවේල රැකීමටය. ඒ නිසා මේ ගතවන මොහොත තාවකාලිකව පියමං කළද වසරකට නොඅඩු කාලයක් තුළ රට ගමන් කළ හැක්කේ එක්කෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසිවලට යට වීමටය. නැතිනම් චීන - ඇමරිකන් - ඉන්දියානු උගුලක හිරවීමටය. ආණ්ඩුවේ ගමනට අනුව ගැලවීමට ඇති මාවත් උගහටය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර පැලවත්ත, බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## '20'න් හෙළි වූ ජාතිවාදයේ තිත්ත ඇත්ත

ජාතිවාදය යනු කිසිදු සමාජයක පැවැතිය යුතු නැති ඉතාමත් ප්‍රතිගාමී ගෝත්‍රික සංකල්පයකි; මනෝභාවයකි. එහෙත් ලොව තුළ 21වැනි සියවසේදීත් ජාතිවාදය පවතී. ජාතිවාදය නැමති මනෝභාවය සමාජය තුළින් ඉවත්කිරීමද ඉතා දුෂ්කරය. ජාතිවාදය ප්‍රතිගාමී මතයක් වුවත් එය මිනිසුන්ගේ සිත් තුළ අක්‍රියව සැඟවී තිබෙනවිට ඉන් සමාජයට බරපතළ හානියක් සිදුනොවේ. එහෙත් එම ජාතිවාදය අවුස්සා එය බලයක් බවට පත්කළ විට එම සමාජයටත් ජනතාවටත් ඉතාම අහිතකර ප්‍රතිඵල ගෙන දෙන්නක් බවට පත්වේ.

අපේ ඓතිහාසික අත්දැකීම් අනුව ජාතිවාදය ඉබේ ඇවිස්සී ගිනි ගන්නේ නැත. එය කවුරුන් හෝ සංවිධානාත්මකව ඇවිස්සිය යුතුය. ලෝක දේශපාලනය තුළ මෙන්ම ලංකාවේද ජාතිවාදය අවුස්සනු ලබන්නේ ධනපති දේශපාලන කණ්ඩායම් විසිනි. ඒ පහසුවෙන් බලය ලබා ගැනීම සඳහාය. සියලු ජාතිවාදයන් මෙයට අයත්ය. ධනපති දේශපාලන කණ්ඩායම් බලය සඳහා ජාතිවාදය ඇවිළුවාලුවද ඔවුන් පංති අර්ථයෙන් ජාතිවාදී නැත. බලය සඳහා ජාතිවාදය අවුළුවන ඔවුන් බලය සඳහාම ඊට ප්‍රතිපක්ෂව කටයුතු කරති. එවිට ඉන් රැවටීමට ලක්වන්නේත්, පීඩාවට ලක්වන්නේත් සියලු ජාතීන්ට අයත් පොදු ජනතාවය. මේ පිළිබඳ ඕනෑතරම් අත්දැකීම් අපේ රටේ දේශපාලන ඉතිහාසයේ පවතී. ඊට එකතුවන අලුත්ම දේශපාලන අත්දැකීම '20'වැනි සංශෝධනයය.

මහින්ද, ගෝඨාභය ප්‍රමුඛ රාජපක්ෂ කල්ලිය මෙවර තමන් වෙත බලය ගැනීම සඳහා සැලසුම් සහගතවම වසර කිහිපයක් තිස්සේ ජාතිවාදය ඇවිස්සූ බව අපි දනිමු. එහිදී ඔවුන් බහුතර සිංහල ජනයා 'බියවැද්දීම' සඳහා යොදා ගන්නේ මුස්ලිම් භීතිකාවය. මුස්ලිම් ජනගහනය වැඩිවීම නැමති ව්‍යාජ භීතියෙන් ආරම්භ කළ එය වඳ කෑම, වඳ ඇඳුම්, වඳ සැත්කම් මගින් සමාජගත කරනු ලැබීය. ඒ සඳහා තමන් විසින්ම නිර්මාණය කළ ජාතිවාදී කණ්ඩායම් හා ජාතිවාදී ජනමාධ්‍ය උපයෝගී කර ගන්නා ලදී. එලෙස වර්ධනය කරමින් ආ මුස්ලිම් භීතිය හා විරෝධයට මුස්ලිම් ජාතිවාදීන් විසින් කළ සමහර අන්තවාදී ප්‍රකාශ හා ක්‍රියාද විශාල උත්තේජනයක් සැපයූ අතර පාස්කු ප්‍රහාරය එහි උච්ඡතම අවස්ථාව විය.

අවසානයේ පසුගිය ජනාධිපතිවරණයේදී හා මහ මැතිවරණයේදී රටේ බෙදුම් රේඛාව නිර්මාණය කළේ සිංහල බෞද්ධ ජාතිවාදය විසිනි. "සුළු ජාතීන්ට යට නොවන ආණ්ඩුවක්", "තනි සිංහල බෞද්ධ ආණ්ඩුවක්" වැනි ජාතිවාදී සටන් පාඨ සමාජගත කළේ රාජපක්ෂවරු ඒ මගින් සිංහල බෞද්ධ සාමාන්‍ය ජනයා මුලා කොට විශාල බලයක් ලබාග න්නා ලදී. එහිදී තමන් වෙත සිංහල බෞද්ධ ජනයා එක්කර ගැනීම සඳහා මුස්ලිම් ජාතිවාදී ධනපති නායකයන් වන හකීම් හා විශේෂයෙන් රිෂාඩ් බදියුදින් සතුරන් ලෙස හඳුන්වන ලදී. එහිදී රිෂාඩ් විරෝධය විශාල විය. එම මුස්ලිම් නායකයින් හා ඔවුන්ගේ පක්ෂවල අය ආණ්ඩුවට යන්නේ නම් තමන් ආණ්ඩුවෙන් ඉවත්වන බවට බොරු අනතුරු ඇඟවීම්ද රාජපක්ෂ පිලේ ජාතිවාදීන් විසින් කරන ලද්දේ සැබෑ ලෙසම ජනතාව රැවටීම සඳහාමය. එසේ නැතුව ඇත්තට නොවේ.

එහෙත් දැන් '20' සම්මත වෙද්දී අවසානයේ සිදුවූයේ කුමක්ද? රාජපක්ෂවරුන් විසින් ත්‍රස්තවාදීන් ලෙස, ජාතිවාදීන් ලෙස, සිංහලයින් වඳකිරීමට කුමන්ත්‍රණය කරන්නන් ලෙස චෝදනා කළ අයගේ ඡන්දවලින්ම '20' සම්මත කර ගැනීමය. 'ඉතිහාසයේ සරදම හැම දෙයක්ම කණපිට පෙරළයි' යනුවෙන් වන කියමන සිහියට නංවමින් රාජපක්ෂවරුන් විපක්ෂයේ සිටි මුස්ලිම් මන්ත්‍රීවරු 06 දෙනක්ගේ හා එක් දෙමළ මන්ත්‍රීවරයෙක්ගේ සහාය ලබා ගත්තේ ආණ්ඩුවේ සිංහල ජාතිවාදීන් හා ජාතිවාදී භික්ෂූන්ද නිරුත්තර කරමිනි.

'20' පිළිබඳ ඡන්ද විමසීමේදී මෛත්‍රීපාලද මඟහැර ගිය තත්වය තුළ ආණ්ඩුව සතුව තිබුණේ ඡන්ද 148කි. ඒ තුනෙන් දෙකට ඡන්ද 02ක් අඩුවෙනි. ඒ අනුව '20' සම්මත කිරීමේදී මුස්ලිම් ඡන්ද 06 තීරණාත්මක විය. ඒ අනුව රාජපක්ෂවරුන් විසින් තමන්ට ඡන්දය දුන් 90%කට වැඩි බහුතර සිංහල ඡන්ද දායකයාට කොකා පෙන්වා මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ සහාය ලබාගෙන 20 සම්මත කර ගන්නා ලදී. දැන් රාජපක්ෂ පාලනයක් තුළ රිෂාඩ්ලා, හකීම්ලා පරසක්වල ගැසීමට බලාහුන් ඡන්දදායකයාට දැන් සිදුව ඇත්තේ 'ගලේ පැහැරූ බළලාට' වූ දේමය. ඉගෙන ගන්නේ නම් මෙය හොඳම හොඳ පාඩමකි.

රිෂාඩ් හා හකීම් '20'ට ඡන්දය නොදුන්නේ ඇයි? ඒ, ආණ්ඩුව සමග වූ එකඟතාවය මතය. රිෂාඩ් හෝ හකීම්ද පක්ෂව ඡන්දය දුන්නේ නම් එය ආණ්ඩුවට ඉතාම අවාසිය. එසේම ඔවුන් දෙදෙනාටද අවාසිය. 'බළලුන් ලවා කොස් ඇට බෑම' කළේ ඒ නිසාය. රිෂාඩ්ගේ හා හකීම්ගේ එකඟතාවය හා අනුදැනුම නොමැතිව ඔවුන්ට අයත් මන්ත්‍රීවරු ආණ්ඩුවට සහය දෙන්නේ නැත. සත්‍යය එයයි.

'20' ජනතාවට පාඩම් රැසක් උගන්වා තිබේ. ඉදිරියටත් උගන්වනු ඇත. ඒවා ඇඟ රිදෙන පාඩම් වීමට ඉඩ තිබේ. දැන් මේ 20 සම්මත කිරීමේදී ජනතාව උගෙන ගත යුතු පාඩම කුමක්ද? ඒ, ජාතිවාදය පිළිබඳ පාඩමයි. ධනපති පංතියට ජාතිවාදය අවශ්‍ය බලය ගැනීම සඳහාමය. පාලනය කිරීමේදී ඔවුන්ට ජාතිවාදය අදාළ නැත. ජාතිවාදය හා ආගම්වාදය මගින් ජනතාව බෙදා වෙන්කරන ධනපති පක්ෂ සමාජයේ සැබෑවටම තිබිය යුතු පංති බෙදීම, එනම් පීඩක හා පීඩිත පංති බෙදීම යටපත් කොට තම පංති වුවමනාව සඳහා බලය ගැනීම සඳහා පමණක් ජාතිවාදය යොදාගනී. ඒ නිසා ජාතිවාදය යනු ධනපති පක්ෂ වල, කල්ලිවල උප්පරවැට්ටියක් මිස අන් යමක් නොවේ. පීඩිත පංතිය භේදකර බලය ගන්නා ඔවුහු භේදයකින් තොරව පීඩිතයින් පාලනය කිරීමට එක්ව කටයුතු කරති. එබැවින් 20න් උගනිමු. අපේ පංතිය භේදකරන ජාතිවාදය පරදවමු. නැගී එන ඒකාධිපති පාලනය පැරදවීමට ජාතිභේද ආගම්භේදවලින් තොරව අත්වැල් බැඳගනිමු. එක්ව සටන් කරමු. එක්ව දිනමු!

# '20' සම්මතයි! දැන්?

ප්‍රසුගියදා පාර්ලිමේන්තුවේදී 20වැනි ව්‍යවස්ථා සංශෝධනය තුනෙන් දෙකේ විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත විය. මෙය ලාංකේය දේශපාලනය තුළ බොහෝ පාඩම් ඉගැන්වූ හා උගන්වන එකක් වනු ඇත. '20' අපේ රටේ දේශපාලනයේ හැරවුම් ලක්ෂයක් සනිටුහන් කරනු ඇත. '20' සම්මත වීම තුළ රාජපක්ෂවරුන්ගේ පවුල් පාලනයේ ජයග්‍රහණය මෙන්ම පරාජයද සැඟවී තිබේ. එහි ධනවාදයේ කෙටිකාලීන ජයග්‍රහණය මෙන්ම දිගුකාලීන පරාජයද සැඟවී තිබේ. එය නිවැරදිව කියවා ගැනීම කාගේත් වගකීමය.

20 සම්මත කර ගැනීම මගින් රාජපක්ෂ පවුල තම බලය උපරිම ලෙස තහවුරු කර ගන්නා ලදී. දැන් ජනාධිපතිවරයාට අධිකරණය හා රාජ්‍ය සේවය තමන්ට අවශ්‍ය ලෙස හසුරුවමින් ඒකපුද්ගල ඒකාධිපති පාලනයක් ගෙන යා හැක. එසේම ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු ඒමට ඉඩ සැලසීම මගින් බැසිල් රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ ඇතුළු එවැනි වර්ගයේ 'දෙබිඩ්ඩන්ට' වාසියක් අත්වී ඇත. ඒවා ඔවුන්ගේ ජයග්‍රහණයන්ය.

එහෙත් ඒ අතරම දැන් ගෝඨාභයලා රටට 'වැඩ' පෙන්විය යුතුය. රට හැදිය යුතුය. දැන් තවදුරටත් නිදහසට කාරණා නැත. කලින් නිතර පැවසූ දේ වූයේ තුනෙන් දෙකේ බහුතර බලයක් වුවමනා බවත් විධායක බලතල අවශ්‍ය බවත්ය. දැන් ඔවුන් අපේක්ෂා කළ සියල්ල තිබේ. දැන් 'පොළොවේ ඇද' පෙන්වීමට ඉඩ නැත. දැන් 'නටා' පෙන්විය යුතුය. නැතිනම් නිදහසට කරුණුද නැතිව ගෝඨාභය රාජපක්ෂලා වැඩ බැරි බොරුකාරයන් බවට පත්වීම වැළැක්විය නොහැක. එබැවින් වත්මන් ධනවාදයේ විසඳිය නොහැකි අර්බුදය විසින් රාජපක්ෂ පාලනය අසමත් පාලනයක් බව ඉතා ඉක්මනින් තහවුරු කරනු ඇත. එය රාජපක්ෂලාට පරාජයට කරුණකි. ඉගෙන ගන්නේ නම් එය ජනතාවට ජයග්‍රහණ ලැබීමට හේතුවන සාධකයකි.

අනෙක් අතට '20' සම්මත වූ ආකාරය විසින්ද රට තුළ තිබූ බරපතළ මිත්‍යාවන් රැසක් බිඳවට්ටන ලදී. රාජපක්ෂවරු ප්‍රතිපත්තියක් නැති බලය ගැනීම එකම ප්‍රතිපත්තියක් බවට පත්කරගත් පිරිසක් බව මින් ඔප්පු විය. ඔවුන්ගේ ව්‍යාජ සිංහල බෞද්ධ සළුපිළි '20' මගින් ගලවා දමා ඇත්තේ රාජපක්ෂවරුන්ට සිංහල බෞද්ධ සළුපිළි ඇන්දවීමට දිවා රෑ වෙහෙස වූ භික්ෂූන් වහන්සේලා ඇතුළු සැමද නිරුවත් කරමිනි. ජනාධිපතිවරණයේදී හා මහ මැතිවරණයේදී සිංහල ඡන්ද ගැනීම සඳහා මුස්ලිම් විරෝධී සිංහල ජාතිවාදය හා ආගම්වාදය යොදාගත් ඔවුන් '20' සම්මත කර ගනිද්දී කිසිදු හිරිකිතයකින් තොරව ඔවුන් විසින්ම 'භයානක මිනිසුන්' ලෙස හංවඩු ගසා සිටි හකීම්ගේ හා රිෂාඩ්ගේ මන්ත්‍රීවරු එක්කර ගන්නා ලදහ. ඒ හකීම් හා රිෂාඩ්ලා සමග අවබෝධයෙනි. දැන් රාජපක්ෂලාගේ මුස්ලිම් විරෝධයේ ලණුව ඇත්තටම ගිල දැමූ අය එය වැමැරීමට නොහැකිව අසරණව සිටිනු පෙනේ. අහෝ ඔවුනට ගිය කල!




අනෙක් අතට මෙරට දේශපාලනයේ ධනපති මුස්ලිම් නායකයන් මොනතරම් අවස්ථාවාදීන්ද යන්නත් ඔවුන් තම වරප්‍රසාද හා වරදාන වෙනුවෙන් මුස්ලිම් ජනයා ඕනෑම මොහොතක පාවාදෙන බවත් යළිත් පෙන්වන ලදී.

ඒ අතර සජිත් ප්‍රේමදාසගේ ඊනියා විපක්ෂ නායකකමද හෑල්ලුවට ලක් කළේ සජිත් යනු දේශපාලනයේ හය හතර නොදත් අඳබාල තත්වයට පත්කරමිනි. ඒ අනුව රටේ සැබෑ විපක්ෂය වීමට සජිත්ගේ හෝ රනිල්ගේ යුඇන්පියට බැරි බවත් සජිත් විපක්ෂ නායකකමට නොව හරක් රංචුවක් බලා ගැනීමටවත් නොගැලපෙන බවත් මින් පෙන්වීය.

'20' සම්මත කර ගැනීම මගින් ගෝඨාභය අතුළු රාජපක්ෂවරු තවත් 'හොඳ' කාර්යයක් කළහ. ඒ රජපක්ෂ කල්ලිය තුළ 'පිළිල' මෙන් ජීවත්වෙමින් රාජපක්ෂ කල්ලියට දේශප්‍රේමී, අධිරාජ්‍ය විරෝධී සායම් තවරමින් තමන්ද දේශප්‍රේමීන් හා රාජපක්ෂ ආණ්ඩුවට මඟ පෙන්වන්නන් ලෙස රඟපාමින් සිටි කිහිපදෙනෙකුගේ සැබෑ තත්වය පෙන්වා දීමය. විමල් වීරවංශ, උදය ගම්මන්පිල, විජේදාස රාජපක්ෂ හා වැසිකිළි යාමට පමණක් 'වම' පාවිච්චි කරන්නේය කියන වාසුදේව වැන්නන් විකටයින් බවට පත්කර නිහඬ කරවීමට ගෝඨාභය විසින් (අවිඥානිකව හෝ) කළ කාර්යය අනර්ඝය. දැන් ඔවුන් රජ වාසල කවටයින් හා දොරටුපාලකයින් බව රටටම තහවුරු වී අවසන්ය. එය හෙට දවස රටට හොඳය.

උපරිම විධායක බලයද සහිත ගෝඨාභය ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුව ඉදිරියේ දැන් ඇත්තේ සුළුපටු අභියෝග නොවේ. එහෙත් 'විධායක බලය' නැමැති ඔටුන්න දාගත් පලියට ඔවුන්ගේ 'මොළය' අලුත් නොවන බවත් අලුත් හැකියාවන් ඇති නොවන බවත් ඉතා පැහැදිලිය. රට තුළ විසඳිය නොහැකි ආර්ථික අර්බුදයක්, ණය අර්බුදයක් තිබේ. එය 'විධායක බලය' මගින් විසඳිය නොහැකිය. විධායක බලය අවශ්‍ය වන්නේ, ණය ගෙවීමට අසමත් වන විට විදේශ බලවතුන්ට රට පාවා දීමටත් ඊට එරෙහිව එල්ල වන මහජන විරෝධයන් යටපත් කිරීමටය; ආර්ථික අර්බුදයේ බර ජනතාව මත පැටවීමටය.

උපරිම විධායක බලයද සහිත ගෝඨාභය ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුව ඉදිරියේ දැන් ඇත්තේ සුළුපටු අභියෝග නොවේ. එහෙත් 'විධායක බලය' නැමැති ඔටුන්න දාගත් පලියට ඔවුන්ගේ 'මොළය' අලුත් නොවන බවත් අලුත් හැකියාවන් ඇති නොවන බවත් ඉතා පැහැදිලිය. රට තුළ විසඳිය නොහැකි ආර්ථික අර්බුදයක්, ණය අර්බුදයක් තිබේ. එය 'විධායක බලය' මගින් විසඳිය නොහැකිය. විධායක බලය අවශ්‍ය වන්නේ, ණය ගෙවීමට අසමත් වන විට විදේශ බලවතුන්ට රට පාවා දීමටත් ඊට එරෙහිව එල්ල වන මහජන විරෝධයන් යටපත් කිරීමටය; ආර්ථික අර්බුදයේ බර ජනතාව මත පැටවීමටය.

ගෝඨාභය පාලනයේ අරාජිකත්වය, අසමත්කම හා එය නොදැන කරන උද්දච්ඡ හැසිරීම මේ මොහොතේද රටට ජනතාවට හානි කරමින් තිබේ. එක් අතකින් මැතදී බ්‍රැන්ඩික්ස් ආයතනයෙන් හා ඒ සමගම මාළු වෙළඳසැලෙන් මතුවූ කොරෝනා පොකුරුවල ව්‍යාප්තිය නතර කර ගැනීමට ගෝඨාභය අසමත්ව සිටී. දැන් කොරෝනා 'පාලනයක්' සිදුවන්නේ නැත. කොරෝනා මැඩලීමේ කටයුතු අරාජිකව පවතී. රට ක්‍රමානුකූලව අක්‍රිය වෙමින් තිබේ. ප්‍රධාන බස් නැවතුම්පොළ වසා දමනු ලැබ ඇත. දුම්රිය විශාල ප්‍රමාණයක් අවලංගු කරනු ලැබ තිබේ. රජයේ කාර්යාල අක්‍රීයය. 'රට වැහුවේ නැති' වුණාට වැහෙමින් පවතී. ඉන් පීඩාවට පත්වන අයට සහනදීමේ වැඩපිළිවෙළක් නැත. වෙළඳ කලාපවල සේවක සේවිකාවෝ විශාල අර්බුදයක පැටලී සිටිති. ඒවාට විසඳුම් නැත. බලය ගත් පසු පාලකයන්ට 'ජනතාව' තවදුරටත් අදාළ නොව බව රාජපක්ෂවරු පෙන්වමින් සිටිති. එහෙත් මෙම අරාජිකත්වය විසින් ජනතාව කලකිරීමට ලක්කෙරෙමින් තිබේ; ආණ්ඩු විරෝධයකට අමුද්‍රව්‍ය සපයමින්ද තිබේ. සත්‍යය එයයි.

අනෙක් අතට දැන් ලෝක බලවතුන්ගේ කෙළිබිමක් බවට ලංකාව පත්ව තිබේ. ලෝකයේ බලවත්තු එකා පසුපස එකා ලංකාවට එති. චීන ඉහළ පෙළේ නියෝජිතයන් පැමිණ ගියේ පසුගිය සැප්. 08 දාය. ඉන්පසු ඉන්දියාව කලබල විය. ඔවුහුද දකුණේ දිස්ත්‍රික්ක 04කට කොන්සල්වරයෙක් පත්කළහ. දැන් ඇමරිකානු රාජ්‍ය ලේකම් පැමිණේ. ඔහු පැමිණීමට පෙර ඔහුගේ දෙවැනියා පවසා තිබුණේ ලංකාව ගමන් කරන්නේ කා සමගද යන්න තෝරාගත යුතු බවය. එය තරමක තර්ජනයකි. ගෝඨාභයගේ විධායක බලයට ඒවා නතර කළ නොහැක. තමන්ගේ වත්ත බැලීමට එන මහත්වරු සේ පොම්පියෝ ලංකාවට පැමිණෙන විට, චීන

07 වැනි පිටුවට



# ඉල් මහේ විරුවාණෙ

ඉර ඇවිත් හැංගී
මේ රාත්‍රිය තවම දිගු වෙයි
මව්බිමට
නිදහස යළිත් ඈතයි

බටහිර අහස බිඳ
ගිජුලිහිණියන් ගොදුරු
ඉල්ලයි

වීදි දිග
ගන අඳුර ලුහුබඳියි
සහෝදර කුරුල්ලන්
එළිය ගෙන පියාඹයි

දිවා රෑ
මෘගයන් ඇවිද ගිය මාවතේ
අත් නෑර
ඔබ රටට
ප්‍රේම කළ බව සැබෑයි
මහ පොළොව ආයෙමත්
ඔබේ නෙත් මඟ යදියි

බිඳුණු තටුපත් වැටුණු
සුසුම් වා තල රැඳුණු
අඳුරු දෙනිපෙත්වලට
අනෝරා වැසි වැටෙයි
ගමන් මඟ
යළිත් රතු මල් පිපෙයි

මේ ඉල්මහත් අඳුරුයි
නුඹ අපට තවත් ළංවෙයි
යළි යළිත් පණ ලබා
නව මඟක් ඇහැරෙයි
අපට අපි වෙන
මේ බිමේ නිදහස නුඹයි

31වැනි ඉල්මහ විරු සමරුව නිමිත්තෙනි...

# ඉල්මහේ නොමියන මතකය

සදාතනික වීරත්වයක, මහා කැපකිරීමක, නොසිඳෙන අධිෂ්ඨානයක, අචල විශ්වාසයක නොමියන මතකයන් සමගින් තවත් ඉල්මහ සැමරුමක් පැමිණ තිබේ. 1989 ඉල් මාසයේ සිට සැම ඉල්මහක්ම අපට විශේෂිතය. ඒ මෙරට නිර්ධන පංති විප්ලවකාරී ව්‍යාපාරය ලෙස, පීඩිත පංතියේ විමුක්තිය වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ නම් දේශපාලන පක්ෂයට මුල්ගල් තබා එය ලංකාවේ ප්‍රධාන වමේ ව්‍යාපාරය බවට පත්කිරීමට නායකත්වය හා දායකත්වය දුන් අපේ යුගයේ ශ්‍රේෂ්ඨ විප්ලවවාදියෙක් වූ රෝහණ විජේවීර සහෝදරයා, ජ.වි.පෙ. හිටපු ප්‍රධාන ලේකම් උපතිස්ස ගමනායක සහෝදරයා ඇතුළු විප්ලවවාදීන්, දේශප්‍රේමීන්, සැබෑ කොමියුනිස්ට්වාදීන් රැසක් මේ බිමට මේ රටට අහිමි කළ මාසය ඉල් මාසය වන නිසාය. 1989 නොවැම්බර් 13 ඒ අඳුරුතම දිනය වූ නිසාය.

ඉල්මහේ වීරත්වයේත් කටුක වේදනාවේත් මතකයන්ට මේ වනවිට වසර 31කි. 1989දී දවා හළුකොට අවසන් තිත තැබීමට හැකියයි සතුරන් විසින් සිතුවද ජනතා විමුක්ති පෙරමුණ අළුදූලි මතින් නැගිට මේ වනවිට දිගු දේශපාලන ගමනක් පැමිණ තිබේ. එම වසර 31ක ගමන් මඟ තුළ ජයග්‍රහණ මෙන්ම පරාජයන්ට මුහුණ දීමටත් විවිධ කල්ලිවාදයන්ට, කුමන්ත්‍රණයන්ට හා පාවාදීම්වලට මුහුණ දීමටත් එයට සිදුවිය. අනෙක් අතට ඒ අතරම නව මිතුරු බලවේග හඳුනා ගැනීමටත්, විවිධ මිතුරු බලවේග එක්කර ගැනීමටත් එය සමත්විය. ධනවාදය තුළ කටයුතු කරන නිර්ධන පංති දේශපාලන පක්ෂයක ඉතිහාසයේ ගමන්මග එසේය. එය රෝස මල් අතුල මාවතක් නොවන බව සැබෑය. ජයග්‍රහණය වැටී තිබෙන්නේ, ගිරිදුර්ග කම්කටොලු බාධක හරහාය. ලෝක ඉතිහාසයේම ජීවමාන අත්දැකීම එයය.

මෙයට වසර 31කට පෙර සිදු වූ මෙම සිදුවීම් පිළිබඳව අපේ රට තුළ නූතන පරපුරට ඇත්තේ නිවැරැදි වැටහීමක් නොවන බව පෙනේ. ජ.වි.පෙ.ට එරෙහිව හැමවිටකම '88-89 ජවිපෙ භීෂණයක්' ගැන සිහිපත් කරන 'නොදරුවන්' දෙස බලන විට එය පෙනේ. මෙය පුදුමවීමට කරුණක්ද නොවේ. පසුගිය කාලයක් පුරා සතුරන් විසින් ජ.වි.පෙ.ට එරෙහිව එල්ලකරන ලද මඩ හා අවලාදවල බලපෑම සමාජ මනෝභාවයන් තුළ තැන්පත්ව තිබේ. 88 - 89 නොදුටු හා ඒ ගැන නොදන්නා පරපුරක අය 'දන්නා ලෙස' ඉදිරිපත් කරන කරුණු තුළ ඇත්තේ එකී සතුරු අවලාදවල හා අසත්‍යයන්ගේ බලපෑමය.

ලෝකයේ සැම විටකම ඉතිහාසය ලියනු ලබන්නේ 'ජයග්‍රාහකයා' විසිනි. ඒ නිසාම ඉතිහාසය යනු 'ජයග්‍රාහකයින්' තමන් සාධාරණය වනු පිණිස ලියනු ලබන්නකි. 'පරාජිතයා' දිනක දිනන තුරු ඉතිහාසය ගොඩනැගෙන්නේ පරාජිතයාට එරෙහිවය. ධනවාදී සමාජ ක්‍රමයකදී තාවකාලිකව වුවත් ධනපති පංතිය ජයගත් විට ධනවාදී ඉතිහාසය ලියන්නේ ඔවුන්ය. එවිට එය නිර්ධන පංති ව්‍යාපාරයට හානිකරන විකෘති සහගත ඉතිහාසයක්වීම වැළැක්විය නොහැක. එම ඉතිහාසය පිරී පවතින්නේ අර්ධ සත්‍යයන්, විකෘති කළ සත්‍යයන්, අසත්‍යයන් හා මඩ අවලාදවලින්ය. ඒ නිසා එක් අතකින් බලන කළ සැබෑ ජනතා බලවේග විසින් නිවැරැදි කරන තුරු ධනවාදීන්ගේ ඉතිහාසය වූ කලී ප්‍රබන්ධයක් වන්නේය. මෙය 88-89ටද පොදුය. මේ නිසාම ඉතාම කෙටියෙන් වුවත් 88-89 නිර්මාණය වූයේ කෙසේද එයට වගකිව යුත්තේ කවුරුන්දැයි විමසා බැලීම නොදන්නා අයගේ දැනගැනීම සඳහා වැදගත්ය.

දැනුවත්ව හෝ නොදැනුවත්ව 1988-89 පිළිබඳව ජ.වි.පෙ.ට ඇඟිල්ල දික්කරන බොහෝදෙනා එමගින් එම භීෂණයේ සැබෑ වගඋත්තරකරුවන් වන එ.ජා.ප. පාලනය නිදොස් කරති. එබැවින් 1988-89 සිදුවීම්වල ආරම්භය හා එහි සැබෑ හේතුව සොයා ගැනීම මෙම සිදුවීම් නිවැරදිව වටහා ගැනීමේදී වැදගත්වේ.

1988-89 සිදුවීම් ගැන ජ.වි.පෙ.න් ප්‍රශ්න කරන බොහෝදෙනා 1983 ජූලි එවකට පැවති ජේ.ආර්. ජයවර්ධන පාලනය විසින් ජ.වි.පෙ. තහනම් කරනු ලැබුවේ ඇයි දැයි නොඅසති. ඒ, එක්කො නොදන්නාකම නිසාය; නැතිනම් කුහකකම නිසාය; එසේත් නැතිනම් තම පංතිය රැකීමේ වුවමනාව නිසාය. එබැවින් ඉල්මහේ මතකය යළි අලුත් කර ගැනීමට නම් අප 1983ට එහා සිදුවූ සිදුවීම්ද යළි මතක් කර ගත යුතුය.

1971 අරගලයෙන් පසු 1976දී ප්‍රසිද්ධ දේශපාලනයට හෙවත් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයට පැමිණි ජ.වි.පෙ. ඒ තුළ වේගයෙන් වර්ධනය වන්නට විය. 1980 වන විටම ලංකාවේ ප්‍රධාන හා විශාලතම වමේ පක්ෂය බවට පත්වීමට එයට හැකිවිය. 1977 මහ මැතිවරණයේදී ආසන 4කට තරඟ වැදුන ජ.වි.පෙ. ඉන්පසු පැවැත්වූ අතුරු මැතිවරණ ඇතුළු සියලු මැතිවරණවලට තරඟ වැදුනි. විශේෂයෙන් 1981 දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණයේදී තරග කර දිස්ත්‍රික් කිහිපයකින් මහජන නියෝජිතයන් 13ක් පත්කර ගැනීමටද ජ.වි.පෙ. සමත් විය.

ඉන්පසු 1982 ජනාධිපතිවරණයේදී පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ඊට තරග වැදුණු අතර ජ.වි.පෙ. ජනාධිපති අපේක්ෂකයා වූයේ රෝහණ විජේවීර සහෝදරයාය. තරගකරුවන් 06 දෙනෙකුගෙන් තුන්වැන්නා වීමට ඔහුට හැකි විය. ජයවර්ධන පාලනය විසින් 1983ට නියමිත මහ මැතිවරණය පවත්වනවා වෙනුවට 1982 දෙසැම්බරයේදී ඒ වන විට පැවති හයෙන් පහේ පාර්ලිමේන්තුව තවත් වසර 05ක් දික්කර ගැනීමේ කුප්‍රකට ප්‍රජාතන්ත්‍ර විරෝධී ජනමත විචාරණය පැවැත්වූ අතර එහිදීද ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මහමැතිවරණය පවත්වා ගැනීම සඳහා ජනමත විචාරණයේදී එ.ජා.ප. වුවමනාවට ප්‍රතිපක්ෂව කටයුතු කළේය. එහෙත් මහා ඡන්ද මංකොල්ලයකින් JR ජනමත විචාරණය ජය ගත්තේය.

මෙහිදී 'ජනමත විචාරණය වංචාවක්. 83 මහ මැතිවරණය පවත්වනු' යන සටන් පාඨය සහිතව ජ.වි.පෙ. උද්ඝෝෂණ මාලාවක්ද ආරම්භ කළේය. ඉන් නොනැවතුනු ජ.වි.පෙ. රෝහණ විජේවීර සහෝදරදයාගේ නමින් ජනමත විචාරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක්ද ගොනුකරන ලදී. ඒ ජනතාවගේ ඡන්ද අයිතිය දිනාගැනීම සඳහාය. එම නඩුව ආණ්ඩුවට අවාසිසහගත වූ අතර ඉන් ආණ්ඩුව පරාජය වුවහොත් යළි මහ මැතිවරණය පැවැත්වීමේ අවදානමට ආණ්ඩුව මුහුණදී තිබුණි. 1983 ජූලි මස අග එජාප ආණ්ඩුව විසින් කිසිදු හේතුවක් නොමැතිව ජ.වි.පෙ. තහනම් කරන්නේ මෙවැනි පසුබිමකය.

1983 දී ජයවර්ධන පාලනය ජ.වි.පෙ. තහනම් කළේ ඇයි? මෙය ඉතා වැදගත් ප්‍රශ්නයකි. සැබැවින්ම ඊට බලපෑ දේශපාලන හේතුව පසුකලෙක ජයවර්ධන මහතා විසින්ම ජනමාධ්‍ය වෙත පවසා තිබුණි. ජ.වි.පෙ. තහනම් කිරීමේ සැබෑ හේතුව පංතිමය හේතුවක් විය. මේ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෙදී දුර්වලව පැවතිණි. සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම නිසා ශ්‍රීල.නි.ප.ය නායකත්ව අර්බුදයක් මත බෙදී පැවතිණි. මෛත්‍රීපාල සේනානායක 'මෛත්‍රී පිල' නිර්මාණය කළ අතර අනෙක් අය 'සිරිමා පිල' ලෙස ක්‍රියාත්මක වූහ. මේ නිසා එ.ජා.ප.යට ශ්‍රීල.නි.ප.ය අභියෝගයක් වූයේ නැත. සැබෑ අභියෝගය වූයේ නැගී එන වමේ ව්‍යාපාරයයි. තමන්ට ඉදිරියේදී මුහුණදීමට සිදුවන දේශපාලන අභියෝගය ජ.වි.පෙ. බව 1983 මැයි දිනයේදී JR විසින් ප්‍රකාශ කළේ මේ අනුවය. එසේම රෝහණ විජේවීර සහෝදරයා විසින් ජනමත විචාරණයට එරෙහිව පවරා තිබූ නඩුවද JRට බරපතළ අභියෝගයක් විය.

1978 දී විධායක ජනාධිපති ක්‍රමය සහිත ඒකාධිපති ව්‍යවස්ථාව නිර්මාණය කොට වෘත්තීය සමිති මර්දනය කරමින්,



ප්‍රගතිශීලීන් දඩයම් කරමින් නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය ලංකාව තුළ ස්ථාපිත කිරීමට කටයුතු කරමින් සිටි ඇමරිකන් ගැති ජයවර්ධන පාලනයට බියවැද්දවීමට හෝ හීලෑකර ගැනීමට නොහැකි බලවේගය වූයේ ජ.වි.පෙ. නිසා එය තහනම් කිරීමට JR කල්පනා කළ බව පෙනේ. 1983 ඔවුන් විසින්ම නිර්මාණය කළ 'කළු ජූලිය' උපයෝගී කරගත් ජයවර්ධන පාලනය ඒ වන විටත් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය තුළ ප්‍රබල ලෙස ක්‍රියාත්මක වෙමින් සිටි ජ.වි.පෙ. ඉතාම අසාධාරණ ලෙස පංති අරමුණු වෙනුවෙන්ම තහනම් කරනු ලැබීය. එබැවින් 1988 - 89 සිදුවීම්වලට මඟ පාදනු ලැබුයේ පක්ෂ තහනම මගින් එවකට පැවැති ජයවර්ධන පාලනයමය. 83 ජවිපෙ තහනම් කරනු ලබන විට ජ.වි.පෙ. කිසිදු නීති විරෝධී හෝ ප්‍රජාතන්ත්‍ර විරෝධී කටයුත්තක් සිදුකර තිබුණේ නැත. එවැනි කිසිදු චෝදනාවක් හෝ අධිකරණ ක්‍රියාමාර්ගයක් ජ.වි.පෙ.ට එරෙහිව නොතිබිණි. එබැවින් ජ.වි.පෙ. තහනම් කිරීම සම්පූර්ණයෙන්ම දේශපාලන හේතු මත සිදු කළ එකක් විය. එය ඒකාධිපති පාලනයක ප්‍රතිඵලයක් ලෙස වටහාගත යුතුය.

**සැබෑ භෞතිකවාදී ඓතිහාසික පදනමක් මත පිහිටා ඉතිහාසය යළි ලියන දිනයක් නිසැකවම උදාවෙන බව අපි දනිමු. එදිනට ඉතිහාසය යළි ලියන්නේ ජයග්‍රාහී ජනතාවන් විසිනි. එදිනට ඉල්මහ විරුවන් පිළිබඳ සියලු අවලාද, බොරු, අසත්‍යයන්, අහෝසි වී සත්‍යය මතුවනු ඇත. මව්බිමේ අඳුරුතම යුගයකදී ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්වය, මව්බිමේ නිදහස හා සමාජවාදය වෙනුවෙන් ආක්‍රමණික හමුදාවකට හා රට පාවාදුන් ද්‍රෝහී පාලනයකට එරෙහිව සටන් කොට දිවි පිදූ වීරයන් ලෙස ඔවුන් ගැන ඉතිහාසයේ ලියවෙනවා ඇත.**

වර්තමානයේ රාජපක්ෂවරුන් ගොඩනැගීමට යන ඒකාධිපති පාලන ක්‍රමයට කුමන හේතු මත හෝ ප්‍රශස්ති ලියන, පවන් සලන සියලුදෙනා අවබෝධකර ගත යුතු සත්‍යය නම් ඒකාධිපතියා ඕනෑම විටක ජනතාවට දෘෂ්ට කළ හැකි බවය. ජනතාවගෙන් ගත් අසීමිත බලය යොදාගත් ජේ.ආර්. ජයවර්ධන විසින් කළ දෙය මීට හොඳම උදාහරණය වේ.

සමහරු සිතන ලෙස ජ.වි.පෙ. තහනම් කළ වහාම එය අවි ගෙන සටන් පටන්ගත්තේ නැත. ජ.වි.පෙ. 83 සිට වසර 2ක් පමණ යනතුරු තම පක්ෂ තහනම ඉවත්කරවා ගැනීමට විශාල උත්සාහයක් දැරුවේය. තහනමත් සමග ජීවිත ආරක්ෂාව සඳහා සැඟවී දේශපාලනය කළ ජ.වි.පෙ. පක්ෂය විසුරුවා හැරියේද නැත. අනෙක් අතට අවි ගත්තේද නැත. රෝහණ විජේවීර සහෝදරයා සැඟවී සිට පක්ෂ තහනම ඉවත්කරවා ගැනීම සඳහා අගවිනිසුරුට, ජනාධිපති ලේකම්ට, මානව හිමිකම් සංවිධානවලට, ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය වැනි සංවිධාන රැසකට ලිපි ලියුවේය. විවිධ ක්‍රියාමාර්ග ගත්තේය. එහෙත් ජයවර්ධන පාලනය ජ.වි.පෙ. තහනම දිගින් දිගටම පවත්වාගෙන ගිය අතර ඉන් නොනැවතී මර්දනයද ආරම්භ කළේය. රෝහණ සහෝදරයා ඇතුළු පක්ෂ නායකයින් රහසිගතව ඝාතනය කිරීමේ සැලැස්මක්ද ආණ්ඩුවට තිබූ බව පසුව හෙළිවිය.

1983 පක්ෂ තහනමෙන් පසු ජයවර්ධන ආණ්ඩුව විසින් මරාදැමූ පළමු ජ.වි.පෙ. සාමාජිකයා වූයේ අනුරාධපුර දිසානායක සහෝදරයාය. 'ජවිපෙ තහනම ඉවත්කරනු' යන පෝස්ටරය අලවමින් සිටියදී අත්අඩංගුවට ගත් ඔහු පොලිසිය විසින් පහරදී මරාදමනු ලැබුවේ 1984 දීය. එසේම 1985 දී මාතර තල්පාවිල ධර්මෙ සහෝදරයාද පොලීසිය විසින් පහරදී මරාදමනු ලැබීය. ඒ වන විටත් ජ.වි.පෙ. කිසිදු නීති විරෝධී හෝ සන්නද්ධ කටයුත්තක් සිදුකර තිබුණේ නැත. ධනේශ්වර පංතියේ මර්දනය එබඳුය.

ඉතිහාසයේ මේ කිසිවක් නොදන්නා දේශපාලන ළදරුවන් 88-89 ගැන දොඩවන විට ඇතිවන්නේ හාස්‍යයෙකි.

ජයවර්ධන පාලනය එක් අතකින් රට තුළ වමේ ප්‍රගතිශීලී සංවිධාන මර්දනය කරමින් ආ අතර අනෙක් පැත්තෙන් උතුරේ උත්සන්නවූ බෙදුම්වාදී අරගලය හමුවේ ඉන්දියාව ඉදිරියේ දණගැසීමේ සූදානමක්ද පවත්වා තිබුණි. දැඩි ඇමරිකානු ගැත්තෙකු වූ ජයවර්ධනට එම ඇමරිකානු ගැතිකම නිසාම ඊට වන්දි ගෙවීමක් ලෙස ඉන්දියාව ඉදිරියේ දණගැසීමට බලකරමින් තිබිණි. ජයවර්ධන සිටියේ රට පාවාදී හෝ 'රජකම' රැකගැනීමේ උත්සාහයකය. මෙය අලුත් හා සංකීර්ණ දේශපාලන තත්වයක් විය.

ජ.වි.පෙ. මූලිකත්වයෙන් 1987 වනවිට 'මව්බිම සුරැකීමේ ව්‍යාපාරය' නමින් බහුජන ව්‍යාපාරයක් නිර්මාණය කරනු ලැබ තිබුණ අතර අතර ඒ තුළ මාදුළුවාවේ සෝභිත, මුරුත්තෙට්ටුවේ ආනන්ද වැනි හිමිවරු හා දිනේෂ් ගුණවර්ධන ඇතුළු දේශපාලන පක්ෂ නායකයන්ද ක්‍රියාත්මක විය. මෙය එ.ජා.ප. මර්දනකාරී හා රට පාවාදීමේ උත්සාහයට එරෙහි උද්ඝෝෂණ පෙරමුණක් විය.

අනෙක් අතට පක්ෂයේ තහනම ඉවත් නොකර දිගටම පවත්වාගෙන යාමත්, පක්ෂ ක්‍රියාකාරීන් ඝාතනය කිරීම හා මර්දනය කිරීමත් ලංකාව ඉන්දියාවට පාවාදීමේ සූදානමත් නිසා දේශප්‍රේමී හා ප්‍රජාතන්ත්‍රවාදී අරගලයක් මතුවූ අතර ජ.වි.පෙ. සන්නද්ධවීම ඇරඹුනේ මේ තත්වය තුළය. 1987 අප්‍රේල් හමුදා කඳවුරු කිහිපයකින් අවි පැහැර ගැනීම කළ අතර එහිදී හමුදා සෙබළුන්ට කිසිදු හානියක් නොවන ලෙස කටයුතු කිරීමටද ජ.වි.පෙ. වගබලා ගත්තේය.

ජ.වි.පෙ. අනාවැකි සනාථ කරමින් 1987 ජූලිවල ජයවර්ධන මහතා ඉන්දියාව සමග ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කළේය. එය පැහැදිලිව රට පාවාදීමේ ගිවිසුමක් විය. ඉන්දියන් හමුදා ලංකාවට ගොඩබසින ලදී. ඊට පෙරම ඉන්දියාව ලංකාවේ ගුවන් සීමා උල්ලංඝනය කොට ලංකාවට 'පරිප්පු දමා' ජයවර්ධන බියපත් කර තිබුණි. ජයවර්ධන මහතා ඉන්දු-ලංකා ගිවිසුම අත්සන්කරනු ලැබුවේ තනි මතයටය. එය අගමැතිට හෝ ඇමති මණ්ඩලයට දන්වා තිබුණේ නැත. ඒ සඳහා ඔහු යොදා ගත්තේ විධායක ජනාධිපති බලයයි. විධායක ජනාධිපති බලයට ප්‍රශස්ති ගයන පවන්සලන අය නොදන්නා ඉතිහාසය එයයි.

කෙසේ වෙතත් රට පාවාදීමේ ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව රට පුරාම විරෝධය ඇවිලිණි. ආණ්ඩුවේ කැබිනට් ඇමති ගාමිණී ජයසූරිය ඉල්ලා අස්විය. රට පුරාම ජනතාව දහස් ගණන් පෙළපාලි ගිය අතර එම සාමකාමී උද්ඝෝෂණවලට වෙඩි තැබූ ආණ්ඩුව 147 දෙනෙකු පමණ ඝාතනය කළේය. 88-89 ගැන දොඩවන ගිරා පෝතකයින් නොදන්නා ඉතිහාසය ඒවාය. මෙම විරෝධය කෙතරම්ද යත් ගිවිසුම අත්සන් කිරීමට පැමිණි ඉන්දීය අගමැති රජිව් ගාන්ධිට ආචාර පෙළපාලියේ සිටි නාවික සෙබළෙකු විසින් රයිපල් බඳෙන් පහරදෙනු ලැබීය. මේ සමග දේශද්‍රෝහී පාලනයට එරෙහිවත් ඉන්දියානු හමුදාවට එරෙහිවත් දේශප්‍රේමී අරගලයන් උද්ඝෝෂණ හා සන්නද්ධ යන පෙරමුණු දෙකේම දියත්වූ අතර සන්නද්ධ පෙරමුණ මෙහෙයවනු ලැබුවේ ජ.වි.පෙ.ද ඇතුළත් දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසිනි. මෙයින් පසු රට තුළ ඇතිවූයේ සිවිල් යුද තත්වයකි. 88-89 යනු එයයි.

රටක සිවිල් යුද්ධයක් යනු තේ පැන් සංග්‍රහයක් නොවන බව අමුතුවෙන් කිවයුතු නැත. ඒ තුළ සිදු නොවිය යුතු බොහෝ දේ සිදුවීමේ ඉඩ තිබේ. සටන්කරන දේශප්‍රේමී වමේ බලවේග මුල සිටම ඉතාම හොඳ විනයක්, අරගලයේ සදාචාරයක් පවත්වාගෙන ගියද යුද්ධයක් තුළ අඩුපාඩු ඇතිවීම වැළැක්විය නොහැක. එබැවින් අතිශයෝක්තියට නගන ලද එවන් සිදුවීම් අල්ලාගෙන පහර ගැසීම මගින් රට පාවාදීමට එරෙහිව සිදුවූ එම අරගලයේ ගෞරවය හා වටිනාකම අවතක්සේරු කළ නොහැක. සැබැවින්ම එම අරගලය තුළ අති අමානුෂික භීෂණයක් පවත්වාගෙන ගියේ ආණ්ඩුවේ පාර්ශවය විසිනි. නිල හමුදාවන්ට අමතරව කොළ කොටි, ස්‍රා, ප්‍රා, වැනි නිල නොවන සන්නද්ධ කල්ලි පවත්වාගෙන යන ලද අතර එමගින් විශාල ලෙස මිනිස් ඝාතන කරන ලදී. බොහෝ ප්‍රදේශවල ආණ්ඩුවේ මැති ඇමතිවරු විසින් වධකාගාර පවත්වාගෙන යන ලදී. එසේම තම විරුද්ධවාදීන් ඝාතනය කොට, පෞද්ගලික වුවමනා මත ඝාතන සිදුකොට ඒ සියල්ල ජ.වි.පෙ. පිට පැටවීමද කරන ලදී. එවැනි ඝාතන කිහිපයක සත්‍යය එළිවූයේ පසු කලෙකය.

88 ජනාධිපති මැතිවරණයේදී ජේ.ආර්. වෙනුවට ප්‍රේමදාස ජනාධිපති වූ අතර ඔහුගේ පාලනය තුළ මර්දනය වඩාත් උත්සන්න විය. මෙම මර්දනයන් අතරම වැඩකරන ජනතාවගේ අරගලයන් කිහිපයක් ජය ගැනීමටද ඊට දායක වූවන්ට හැකි විය. කෙසේ වෙතත් අවසානයේ සතුරා ජයගත් අතර රෝහණ විජේවීර සහෝදරයාත්, උපතිස්ස ගමනායක සහෝදරයාත් අත්අඩංගුවට ගෙන 89 නොවැම්බර් 13වැනි දින අත්අඩංගුවේ සිටියදී මරාදමන ලදී. එම ඝාතන සාධාරණය කිරීමට බොරු පුවත් ගොතන ලදී. දේශප්‍රේමී අරගලය තාවකාලිකව පරාජය වූයේ එසේය. රෝහණ සහෝදරයා ඇතුළු විප්ලවවාදීන්, දේශප්‍රේමීන් රැසක් දිවි පිදුවේ එම අරගලය තුළය. අරගලයේ ඇතැම් අඩුපාඩු පිළිබඳව විප්ලවාදී ව්‍යාපාරයක් ලෙස අප වගකිවයුතු අතර එහි මහා විනාශය හා භීෂණය පිළිබඳව වගකිව යුත්තේ එ.ජා.ප. ධනපති පාලනයය. සත්‍යය එයයි.

ඉල්මහ විරුවන් දිවිපිදුවේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් නොවේ. ඔවුන්ගේ අරමුණ ඉතා පුළුල් හා උතුම් එකකි. ඔවුන් සටන් කළේ මුදල් හෝ වරප්‍රසාද වෙනුවෙන් නොවේ. ඔවුන් වීරයන් වන්නේ ඒ නිසාය. මවුබිමේ නිදහස වෙනුවෙන් සටන් නොකරන්නා සැබෑ දේශප්‍රේමියෙක් නොවේ. එබැවින් වර්තමානයේ සිටින ව්‍යාජ දේශප්‍රේමීන් මෙන් නොව ඉල්මහ විරුවෝ සැබෑ දේශප්‍රේමීහු වූහ. එසේම ඔවුනට අවසාන අරමුණක්ද තිබිණි. ඒ, මෙරට විදේශ ආධිපත්‍යයෙන් නිදහස් කරගෙන සමාජවාදී සමාජයක් ගොඩනැගීමය. වර්තමාන යුගයේදී කිසිදු රටකට සමාජවාදයෙන් තොරව ස්වෛරී ස්වාධීන රාජ්‍යයක් බවට පත්විය නොහැකි බවත් මේ යුගයේ සැබෑ දේශප්‍රේමීන් විය හැක්කේ ධනවාදයට එරෙහිව සමාජවාදය වෙනුවෙන් සටන් කිරීමේ අයට පමණක් බවත් ඔවුන් අපට හොඳින් වටහාගෙන තිබුණි. ඔවුන් ශ්‍රේෂ්ඨ වන්නේ ඒ නිසාය.

සැබෑ භෞතිකවාදී ඓතිහාසික පදනමක් මත පිහිටා ඉතිහාසය යළි ලියන දිනයක් නිසැකවම උදාවෙන බව අපි දනිමු. එදිනට ඉතිහාසය යළි ලියන්නේ ජයග්‍රාහී ජනතාවන් විසිනි. එදිනට ඉල්මහ විරුවන් පිළිබඳ සියලු අවලාද, බොරු, අසත්‍යයන්, අහෝසි වී සත්‍යය මතුවනු ඇත. මව්බිමේ අඳුරුතම යුගයකදී ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්වය, මව්බිමේ නිදහස හා සමාජවාදය වෙනුවෙන් ආක්‍රමණික හමුදාවකට හා රට පාවාදුන් ද්‍රෝහී පාලනයකට එරෙහිව සටන් කොට දිවි පිදු වීරයන් ලෙස ඔවුන් ගැන ඉතිහාසයේ ලියවෙනවා ඇත. එබැවින් සතුරන්ගේ හා නොමග ගිය වුන්ගේ අවලාද, අවමාන, අපහාස නොසලකා සමාජවාදය වෙත සැබෑ නිදහස වෙත මානව විමුක්තිය වෙත ඔවුන් ගිය මගේ නොසැලී ගමන් කිරීම හා ඔවුන් අතින් ගිලිහුණු රතු ධජය ජයග්‍රහණය තෙක් නොසැලී ඔසවාගෙන යාම ඔවුන් වෙනුවෙන් අපට කළ හැකි ලොකුම උපහාරය වනු ඇත. ඉල්මහ විරුවන්ගේ නාමයත්, කාර්යයත් දිගුකල් පවතිවා!

# සැබෑ දේශප්‍රේමීත්වය සමාජවාදය සමගයි



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්
ටිල්වින් සිල්වා සහෝදරයා

***නියමුවා:- මෙවර 31 වන ඉල්මහ සමරුව ඔබ පවත්වන්නේ කෙසේද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** කොවිඩ් 19 වසංගත තත්වය අපට වෙනදා වගේ ඉල්මහ සමරුව විශාල පිරිසක් එක්ක පවත්වන්න බාධා කරලා තිබෙනවා. ඒ නිසා අපට මෙවර ඉල් සමරුව පවත්වන්න වෙලා තියෙන්නෙ සංකේතාත්මක සමරුවක් විදිහට. කොහොම නමුත් අපි කුමන තත්වයක් තුළ හෝ ඉල්මහ සමරුව ගැන කථා කරනවා. ඉන් ලද හැකි අත්දැකීම්, ධෛර්ය. කැපකිරීම්, අධිෂ්ඨානය වැනි ගුණයන් එකතු කරගන්නවා.

***නියමුවා :- 31වැනි වරට ඉල්මහ විරුවන් සමරන මේ වර්තමාන මොහොත ඔබ තේරුම් ගන්නේ කොහොමද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** 1980 දශකයේ වගේම දැනුත් අපේ රට විශාල ආර්ථික, දේශපාලන අර්බුදයකට මුහුණදී ඉන්නවා. රටේ ආර්ථිකය වැටිලා, රට ණය බරින් මිරිකිලා, තව තවත් ණය ගන්න පාලකයින්ට සිදුවෙලා. රට හදන දැක්මක්, සැලස්මක් නැති පාලකයෝ එදාවේල වෙනුවෙන් රට ණය කරනවා. ණය ගෙවාගන්න බැරිවුණාම රට විකුණනවා. පාවා දෙනවා. ඊට එරෙහිව මතුවන ජනතා විරෝධය මැඩපවත්වන්න ඒකාධිපති බලතල වැඩිකර ගන්න උත්සාහ කරනවා. අද අපේ රට ලෝක බලවතුන් කීපදෙනෙක්ගේ කෙළිබිමක් කරලා තියෙන්නෙ. එක පැත්තකින් චීනය, අනෙක් පැත්තෙන් ඇමරිකානු අධිරාජ්‍යවාදී කඳවුර, අනෙක් අතට ආසන්නයේම ඉන්දියාව මෙම බලවතුන්ගේ පීඩනය මැද මේ හැමදෙනාම සතුටු කිරීමට යාමත් ඒ සඳහා රටේ සම්පත් හා ස්වාධීනත්වය ටිකෙන් ටික පාවාදීමත් තමයි දැන් ඊනියා දේශප්‍රේමයේ නාමයෙන් සිද්ධවෙන්නේ. මීට තරමක් සමාන තත්වයක් තමයි 80 දශකයෙත් තිබුණේ. මේක රටේ නිදහසට වගේම ප්‍රජාතන්ත්‍රවාදයටත් අනතුරු ගෙනෙන තත්වයක්. මේ තත්වය අපේ රටේ ජනතාව ගැඹුරින් තේරුම් ගත යුතුය කියල අපි හිතනවා.

***නියමුවා:- හොඳයි, ඔබ ඉල්මහ විරුවන් සැමරුවත් රට තුළ 88-89 පිළිබඳව ජ.වි.පෙ.ට විශාල විවේචනයක් තියෙනව නේද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඔව්. රට පාවාදුන්, දැනුත් පාවාදෙන, ඉල්මහ විරුවන් මරාදාපු හා ඊට උදව්කරපු ධනේශ්වර පක්ෂ හා ආණ්ඩු තමන්ගේ ජනමාධ්‍ය පාවිච්චි කරල 88-89 පිළිබඳව එහෙම වැරදි මතයක් සමාජය තුළ හදලා තියෙනවා. අධිපති මතවාදය විසින් වපුරපු එම මතයේ අඥාන ගොදුරු බවට පත්වුණු අය තමයි කිසිවක් නොදැන අපිට චෝදනා කරන්නේ.

***නියමුවා:- 88-89 කාලයේ සිදුවුණ එම අරගලය ඔබ හඳුන්වන්නෙ කොහොමද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** පැහැදිලිවම ඒක දේශප්‍රේමී අරගලයක්. සමාජවාදය අවසන් අරමුණ කර ගත්තු දේශප්‍රේමී අරගලයක්. ඉන්දියානු බලවතාට ලංකාව පාවාදී විදේශ හමුදාවක් ලංකාවට ගෙන්වීමට එරෙහිවත්, ඒකාධිපති පාලකයෙකුගේ අත්තනෝමතික ධනපති පාලනයට එරෙහිවත් ඇවිළුණු තර්කානුකූල අරගලයක්. ඒක එක්තරා අර්ථයකින් මහජන සහාය ලැබූ පුළුල් අරගලයක්. ඒත් ඒ අරගලය ලෙයින් යකඩින් මර්දනය කරපු, දේශප්‍රේමීන් දහස් ගණන් ඝාතනය කරපු පාලක පංතියක් ඊට ගෞරවය දෙන්නේ නැහැ. ඔවුන්ගේ දේශද්‍රෝහිත්වය හා පාවාදීම සාධාරණය කර ගැනීමට අපේ අරගලයට මඩ ගහනවා. ඒකයි ඇත්ත.

අපේ රටේ දේශප්‍රේමී, යටත්විජිත විරෝධී අරගල කලිනුත් සිදුවෙලා තියෙනවා. 1818 ඌව වෙල්ලස්ස කැරැල්ල, 1848 මාතලේ කැරැල්ල ඒ වගේ දේවල්. ඒ අවස්ථාවලත් සුද්දෝ එම අරගලවලට නායකත්වය දීපු කැප්පෙටිපොලලා, පුරන්අප්පුලා හැඳින්වූවේ රාජද්‍රෝහීන් විදිහට, ත්‍රස්තවාදීන් විදිහට, කැරැලිකරුවන් විදිහට. ඒ තමයි පාලකයින්ගේ හැටි. ඒත් මෙතන හාස්‍යයට කරුණ තියෙන්නේ 1818 අරගලය ඉහළින් වර්ණනා කරන, 1848 මාතලේ කැරැල්ල වර්ණනා කරන මාතලේ කච්චේරිය ගිනිබත් කිරීම චිත්‍රපට හදල පෙන්වන කැප්පෙටිපොල, පුරන්අප්පු වීරයින් ලෙස සලකන ඇතැම් අයම 88-89 ගැන විකාර කථා කීමයි. 88-89 අරගලය 1818, 1848 අරගලවලටත් වඩා ඉදිරියෙන් තියෙන්නේ. 1818, 48 අරගල යටත්විජිත විරෝධී වුණාට එහි අරමුණ වුණේ රාජාණ්ඩුව යළි අතිකිරීමයි. ඒ මොහොතේ යථාර්ථය ඒක තමයි. කොහොම වුණත් 88 - 89 කාලයේ අරගලයේ අරමුණ තුළ සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීමත් ගැබ්වෙලා තිබුණා. ඒ නිසා ඒක වඩාත් ප්‍රගතිගාමී එකක්.

> 88-89 අරගලය 1818, 1848 අරගලවලටත් වඩා ඉදිරියෙන් තියෙන්නේ. 1818, 48 අරගල යටත්විජිත විරෝධී වුණාට එහි අරමුණ වුණේ රාජාණ්ඩුව යළි අතිකිරීමයි. ඒ මොහොතේ යථාර්ථය ඒක තමයි. කොහොම වුණත් 88 - 89 කාලයේ අරගලයේ අරමුණ තුළ සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීමත් ගැබ්වෙලා තිබුණා. ඒ නිසා ඒක වඩාත් ප්‍රගතිගාමී එකක්.

***නියමුවා:- ඉල්මහ අරගලයේ අමිහිරි අත්දැකීම් විඳපු පක්ෂයක් ලෙස නැවත එවැනි තත්වයක් ඇතිවෙයි කියල ඔබ හිතන්නේ නැද්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** නැහැ. මොකද දැන් තත්වයන් වෙනස්වෙලා තියෙන්නේ. 88 - 89 අරගලයෙන් අපි පාඩම් ඉගෙනගත්තා වගේම ධනපති පාලකයොත් පාඩම් ඉගෙන ගත්තා. ඔවුන්ටත් හානි වුණා. ජනතාවත් පාඩම් ඉගෙන ගත්තා. ඊනිසා යළි එවැනි තත්වයන් ඇති වෙන්න ඉඩක් නැහැ. අපි එවැනි තත්වයක් ඇතිවෙන්න දෙන්නේ නැහැ. නව ලිබරල්වාදය කරපින්නා ගත්තු ගෝඨාභය රාජපක්ෂලා, ව්‍යවස්ථා සංශෝධනය කරගෙන නැවත JRට අඳින්න හදන එක ඇත්ත. ඒත් මේක JRගේ යුගය නොවෙයි. ගෝඨාභයලට JR වෙන්න බැහැ. මේ පාලනය හොඳටම දුර්වලයි. අර්බුද ගොඩක ඉන්නේ. ඒ නිසා JR කෙනෙක් වෙන්න ගෝඨාභයට (GRට) බැහැ. දැනටමත් මේ අය විහිළුකාරයෝ බවට පත්වෙලා ඉවරයි. අද ජ.වි.පෙ. තනි පක්ෂයක් නොවෙයි. ලොකු සමාජ ව්‍යාපාරයක්. ඒ නිසා තත්වයන් සමාන වගේ පෙනුණට වෙනස්කම් රැසක් තියෙනවා.

අනෙක් අතට වරක් මාක්ස් මෙහෙම කිවුවා. 'ලෝක ඉතිහාසයේ සමහර පෞරුෂයන් දෙවරක් ඇතිවන බව කිව හැකි යැයි හෙගල් වරක් පැවසීය. එහෙත් ඔහුට මෙලෙස එකතු කිරීමට අමතක විය. ඒවා ඇති වන්නේ ප්‍රථම වරට ඛේදජනකයක් ලෙසත්, දෙවැනිවර හාස්‍යජනකයක් ලෙසිනුත්ය'. ඉතින් JR නව ලිබරල්වාදය කරගහගෙන, ලෝක බලවතුනට යටත්වෙලා, ඒකාධිපතියෙක් වෙලා ඛේදවාචකයක් නිර්මාණය කළා. දැන් ගෝඨාභය හදන්නෙ ඒකම වෙනස් විදිහකට කරන්න නම් ඔහුට හැකි වන්නේ හාස්‍යජනකයක් වීම පමණයි.

***නියමුවා:- මේ තත්වය පරාජය කිරීම, වෙනස් කිරීම කළ හැක්කේ කොහොම කියලද ඔබ හිතන්නේ?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඉතා පැහැදිලියි. මේ විවිධාකාරයෙන් අපි ඉදිරිපිට ප්‍රකාශයට පත්වෙන්නේ ධනවාදයේ අර්බුදය. ධනවාදය දැන් යල්පැනලා ඉවරයි. ඒක දුගඳ හමන මළකුණක්. ඒක පවත්වාගෙන යන්න තමයි ඒකාධිපතියෙක් ඕනෑ වෙන්නේ. ඒක පවත්වාගෙන යන්න තමයි ණයකාරයෙක් වෙන්නෙ. ලෝක බලවත් රටවලට යටවෙන්න සිදුවෙන්නේ. ඒ නිසා මේ බංකොලොත් සමාජ ආර්ථික ක්‍රමය නැවත නිවැරදි කරන්න බැහැ. මේක සුද්ද පවිත්‍ර කරලා සාධාරණ සමාජයක් හදන්න බැහැ. මේ බංකොලොත් ක්‍රමය රකිමින් දේශප්‍රේමී වෙන්නත් බැහැ. මේක රකින අය එක්කො ඒකාධිපතිත්වයට ඍජුව සහය දෙන්න ඕනෑ. නැත්නම් බොරු දේශප්‍රේමයට මුවාවෙලා බලය හොයන තක්කඩියෙක් වෙන්න ඕනෑ. ඒ නිසා ඉල්මහ විරු සමරුව අභියස ඉඳගෙනම අපි අවධාරණය කරනවා, වර්තමානයේ අපේ රට ඉදිරිපිට තියෙන සියලුම අර්බුදවලට විසඳුම සමාජවාදී සමාජයක් බව. දැන් සැබෑ දේශප්‍රේමීත්වය, අධිරාජ්‍ය විරෝධීත්වය ගැලපෙන්නේ සමාජවාදී අරමුණු එක්ක විතරයි.

# නව ලෝක බල තුලනය සහ චීන විරෝධී සමුළුව



චීන විරෝධී ඉන්දු - පැසිෆික් සිව් පාර්ශ්වික සන්ධානයේ (එක්සත් ජනපදය, ජපානය, ඕස්ට්‍රේලියාව හා ඉන්දියාව) දෙවන සමුළුව පසුගිය ඔක්. 09වැනි දින ජපානයේදී පවත්වනු ලැබුණි. පසුගිය සමය ඉන්දියානු සාගර කලාපයේත් පැසිෆික් සාගර කලාපයේත් බල තුලනයට වැදගත් වන සිදුවීම් ගණනාවක්ම සිදු වූ කාල වකවානුවක් විය. 2020 සැප්. 23වැනිදා මාලදිවයින හා එක්සත් ජනපදය අතර එක්සත් ජනපදයේදී ආරක්ෂක ගිවිසුමක් අත්සන් තැබීමත් චීනයේ ඉහළ පෙළේ නියෝජිතයකු වූ යං ජියෙෂිගේ ශ්‍රී ලංකා චාරිකාවත් ඔක්තෝම්බර් මාසය අගට යෙදී ඇති එක්සත් ජනපද රාජ්‍ය ලේකම් මයික් පොම්පියෝගේ ඉන්දියානු හා ශ්‍රී ලංකා ගමනත් ඒ අතර වේ. මෙකී සිදුවීම් ඉන්දු හා පැසිෆික් සාගර කලාපයේ භූ දේශපාලනික බල තුලනය කෙරෙහි බලපාන, එහි බල තුලනය යළි සකස්වීමකට අවකාශ විවර කරන සිදුවීම්ය.

සමස්ත ලෝකයේත් විශේෂයෙන් ඉන්දු පැසිෆික් සාගර කලාපයේත් දැනට පවත්නා භූ දේශපාලනික බල තුලනයේ වෙනසකට අවශ්‍ය ආර්ථික හා දේශපාලනික වෙනස්කම් සැලකිය යුතු ප්‍රමාණයක් මේ වන විට වර්ධනය වී තිබේ. විශේෂයෙන් චීනය හා ඉන්දියාව අතරත් චීනය හා එක්සත් ජනපදය අතරත් බල තුලනයේ යළි සකස් වීමක් එකී තත්වයන් විසින් ඉල්ලා සිටින බව පෙනේ. 1990 දශකයේදී චීනයේ දළ ජාතික නිෂ්පාදනය (එක්සත් ජනපද ඩොලර් බිලියන 360) දළ වශයෙන් අද ඉන්දියාවේ දළ ජාතික නිෂ්පාදනයට සමානය. අද චීනයේ දළ ජාතික නිෂ්පාදිතය ඉන්දියාවේ දළ ජාතික නිෂ්පාදිතය මෙන් පස් ගුණයකට වඩා වැඩිය. එනම් එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 14 කට වඩා වැඩිය. එසේම 1990 දී චීනයේ දළ ජාතික නිෂ්පාදිතය එකල එක්සත් ජනපද දළ ජාතික නිෂ්පාදිතයෙන් 1/20 කට වඩා අඩුය. අද චීනයේ දළ ජාතික නිෂ්පාදිතය එක්සත් ජනපද දළ ජාතික නිෂ්පාදිතයට වඩා කුඩා වන්නේ 1.5 ගුණයකිනි. 1990 දී චීනයේ දළ ජාතික නිෂ්පාදිතය ඕස්ට්‍රෙලියාවේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 59% ක් වුවද අද චීනයේ දළ ජාතික නිෂ්පාදිතය ඕස්ට්‍රේලියාව මෙන් 08 ගුණයක් විශාල වී තිබේ. ලෝක ආර්ථිකයේ දෙවන ස්ථානයට පත්ව තිබූ ජපානය අභිබවමින් චීනය දෙවන ස්ථානයට පත්වී ඇති අතර කොරෝනා වසංගත තත්වයෙන් පසු ලෝකයේ වර්ධනය වන එකම ආර්ථිකය බවට පත්ව ඇත්තේ චීන ආර්ථිකයයි.

අනෙක් අතට චීනයේ ආර්ථික හැකියාව එරට යුදමය හැකියාව පුළුල් කිරීම සඳහාත් නව තාක්ෂණික හැකියාවන් වර්ධනය සඳහාත් වැඩි මුදලක් වෙන්කිරීමට අවකාශ ලබාදී තිබේ. චීනයේ ආරක්ෂක වියදම ඉන්දියාව මෙන් හතර ගුණයක් වන අතර එක්සත් ජනපද ආරක්ෂක වියදමින් 1/3කි. චීනයේ නාවුක බලය නැව් හා සබ්මැරින 350ක්ද සමගින් ලොව විශාලම නාවික බලය ලෙසද වර්ධනය වෙමින් තිබේ.

ආර්ථිකයේ හා දේශපාලනයේ මෙකී වෙනස්කම් විසින් බල තුලනයේ හා රටවල් අතර සබඳතාවල ස්වභාවයන්ගේද වෙනසක් ඉල්ලා සිටිමින් තිබේ. ලෝක ආණ්ඩුව, ජාත්‍යන්තර නීතිය, ජාත්‍යන්තර ආයතන, කාලතුවක්කු කටක බැඳ ඇති මකුළු දැලක් වැනිය. එක් එක් රටවල් අතර සබඳතාවල ස්වභාවය තීරණය කරනුයේ ඒ ඒ රටවල බලයේ ස්වභාවය විසිනි. මේ හේතුව නිසා චීනය තවදුරටත් ඉන්දියාව හා එක්සත් ජනපදය අතරත් ජපානය, ඕස්ට්‍රේලියාව වැනි අනෙකුත් රටවල් සමගත් කලින් පැවැති සබඳතා ස්වරූපය නොවෙනස්ව ඒ අයුරින්ම පවත්වාගෙන යාමට ඇති ඉඩකඩ අඩුය. මේ නිසා චීනය හැකි සෑම විටකම සාමකාමීව නැතහොත් වෙනත් ආකාරයන්ගෙන් හෝ නව ආකාරයක සබඳතාවන්ට පිවිසීමට උත්සාහ කරනු ඇත. එහෙත් ඒ අතරම එක්සත් ජනපදය ඇතුළු අනෙකුත් රටවල් තමන්ගේ තත්වය එලෙසින්ම පවත්වාගෙන යාම සඳහා වෙන් වෙන්වත්, සාමූහිකවත් කටයුතු කරනු ඇත.

චීනය සිය Belt & Road Initiative හෙවත් 'නූතන සේද මාවත' වැඩසටහන යටතේ බංගලාදේශය, මියන්මාරය, නේපාලය, ශ්‍රී ලංකාව වැනි රටවල උපක්‍රමික මාර්ග හා වරාය පද්ධතියක් ගොඩනගමින් සිටී. ඒ අතරම එම රටවල් ණය උගුලක සිරකරමින්ද චීනයේ ක්ෂින්ග් ජියැං පළාතේ සිට පාකිස්තානයේ බලුකිස්ථාන් පළාතේ ග්වාඩාර් වරාය දක්වා චීන පකිස්ථාන ආර්ථික කොරිඩෝවක් සාදා ග්වාඩාර් වරායේ චීන විමුක්ති හමුදා බණ්ඩයක් ස්ථානගත කිරීම අරමුණු කර ගනිමින්ද දැනටමත් 'ඩිජිබොවුටි'හි එවැනි හමුදා කඳවුරක් ස්ථාපිත කරමින්ද දකුණු චීන මුහුදේ උපක්‍රමිකව වැදගත් ස්ථාන අත්පත් කර ගනිමින්ද සිටී. ඊට ප්‍රතිවිරුද්ධව එක්සත් ජනපදය, ඉන්දියාව, ඉන්දුනීසියාව, වියට්නාමය වැනි රටවල් සමග උපක්‍රමික එකඟතාවන්ට පිවිසීමට උත්සාහ කරමින් කලාපය තුළ එක්සත් ජනපදයට පක්ෂපාතී කඳවුරක් ගොඩනැගීමට උත්සාහ කරමින් සිටී. චීන විරෝධී ඉන්දු පැසිෆික් සිව්පාර්ශ්වික සන්ධානයද එවැන්නකි.

චීන විරෝධී ඉන්දු පැසිෆික් සිව් පාර්ශ්වික සන්ධානයේ දෙවන සමුළුවේදී එක්සත් ජනපද රාජ්‍ය ලේකම්වරයා චීනයේ සූරාකෑමට, දූෂණයට හා බලහත්කාරයට එරෙහිව සියලු රටවල් එක්විය යුතුයයි ප්‍රකාශ කර සිටියේය. එහෙත් එම සමුළුව අවසානයේදී චීනයේ නම සඳහන් කරමින් කිසිදු පොදු ප්‍රකාශයක් නිකුත් කිරීමට සමුළු නියෝජිතයින් අසමත් වීමද මෙහිදී සිදුවූ විශේෂ සිදුවීමකි. ඊට හේතු වී ඇත්තේ ජපානය හැරුණු කොට අනෙක් රටවල් එක් හෝ තවත් ආකාරයකින්, විශේෂයෙන්ම ආර්ථිකමය වශයෙන් චීනය සමග බැඳී සිටීමයි. මේ අතර නොවැම්බර් මාසයේදී ඕස්ට්‍රේලියාව හා එක්සත් ජනපදය අරාබි මුහුදේ යුද අභ්‍යාසයක් පැවැත්වීමටද සැලසුම් කර තිබේ.

**වර්ධනය වන මෙම තත්වය චීනය හා එක්සත් ජනපදය අතර 'සීතල යුද්ධයක්' බවට පත්වනු ඇතැයි දේශපාලන විචාරකයන්ගේ අදහසය. එහෙත් එය මීට පෙර සමාජවාදී කඳවුර සහ අධිරාජ්‍යවාදී කඳවුර අතර පැවති ආකාරයේ සීතල යුද්ධයක් විය නොහැකිය. එය අන්තර් අධිරාජ්‍ය ප්‍රතිවිරෝධය ප්‍රකාශ කෙරෙන ආකාරයේ සීතල යුද්ධයක් වීමේ වැඩි ඉඩකඩක් ඇත.**

## කියුබාව: ඇ.එ.ජ. විරෝධය පරදවා මානව හිමිකම් පුටුවකට



කියුබාව පස්වන වරටත් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට තේරී පත්විය. කියුබාව මෙලෙස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට තේරී පත් වන්නේ එය වළක්වාලීමට එක්සත් ජනපදය ගත් ප්‍රබල උත්සාහය පරාජය කරමිනි. එහිදී කියුබාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් අතරින් 80%ක සහය දිනාගැනීමට සමත් විය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම තුළ ලතින් අමරිකානු හා කැරිබියන් කලාපයට හිමි වී ඇති ආසන අටකින් එකක් මෙලෙස කියුබාවට හිමි විය.

## බොලීවියාව: මොරාලේස්ගේ පක්ෂයට විශිෂ්ට ජයක්



හිටපු ජනාධිපති ඊවෝ මොරාලේස් පිටමං කරමින් බොලිවියාවේ පැවති ජනාධිපතිවරණයේදී සහ මහ මැතිවරණයේදී හිටපු ජනාධිපති ඊවෝ මොරාලේස්ගේ පක්ෂය වන සමාජවාදය සඳහා වන ව්‍යාපාරය (MAS) විසින් ඉදිරිපත් කරනු ලැබූ අපේක්ෂකයා ජය ලැබීය. ඊවෝ මොරාලේස්ගේ පාලන සමයේදී ආර්ථික ඇමතිවරයා ලෙස කටයුතු කළ ලුයිස් ආර්ස් (Luise Arce) සමස්ත ඡන්ද සංඛ්‍යාවෙන් 52.4% ක ප්‍රතිශතයක් ලබා ගනිමින් ජනාධිපතිවරයා ලෙස තේරී පත් විය. ඔහුගේ ප්‍රතිවාදියා වූ පුරවැසි සමාජයේ (Citizens Community) කාර්ලෝස් මෙසාට (Cavlos Mesa) ලබාගත හැකි වූයේ 31.5%ක ඡන්ද ප්‍රතිශතයක් පමණි.

මීට අමතරව පාර්ලිමේන්තුවේ ඉහළ මන්ත්‍රී සභාවේත් සෙනෙට් සභාවේත් බහුතරය දිනා ගැනීමට සමාජවාදය උදෙසා වු ව්‍යාපාරය සමත් විය. මෙය මොරාලේස් රටින් පිටුවල් කර නව ලිබරල්වාදී පාලනයක් බලයට පත් කිරීමේ කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙලට අත් වූ දරුණු පරාජයකි.

## ඉරානය: වසර 13ක අවි සම්බාධක ඉවත් කරගනිමින්...



එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් ඉරානය වෙත පනවා තිබූ දහතුන් අවුරුදු සම්ප්‍රදායික අවි පිළිබඳ සම්බාධක පසුගිය ඔක්තෝබර් 18වැනිදා අවසන් විය. මේ සමගම ඉරානයට ඉදිරියේදී වෙනත් රටවලින් සම්ප්‍රදායික අවි එනම් මිසයිල, හෙලිකොප්ටර්, යුද ටැංකි බාධාවකින් තොරව මිලදී ගත හැකි වේ. පසුගිය අගෝස්තු මාසයේදී එක්සත් ජනපදය විසින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය හමුවේ මෙකී සම්බාධක දින නියමයකින් තොරව දීර්ඝ කිරීම සඳහා යෝජනාවක් ගෙන ආවද එය ආරක්ෂක මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. 14 දෙනෙකුගෙන් යුක්ත වූ ආරක්ෂක මණ්ඩල සාමාජිකයින් අතරින් ඊට පක්ෂපාතිත්වය ප්‍රකාශ කළේ ඩොමිනිකානු ජනරජය පමණි. ප්‍රංශය, ජර්මනිය සහ බ්‍රිතාන්‍යය ඡන්දය දීමෙන් වැළකී සිටි අතර චීනය හා රුසියාව ඊට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේය.

## ඉන්දුනීසියාව: කලාපයේ ඇ.එ.ජ. යුද වුවමනාවන්ට පිටුපා




එක්සත් ජනපදයේ ෂ-08 පොසෙයිඩෝන් සාගර විමර්ශන ගුවන් යානා ඉන්දුනීසියානු භූමියේ ගොඩ බෑමටත් ඉන්ධන ලබා ගැනීමටත් ඉඩ දෙන ලෙසට එක්සත් ජනපදය ඉන්දුනීසියානු රජයෙන් කරන ලද ඉල්ලීම එරට රජය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ තිබේ. දැනට දකුණු චීන මුහුදේ චීනයේ කටයුතු පිළිබඳ සොයා බැලීම සඳහා එක්සත් ජනපදය යොදා ගනු ලබන්නේ ඉහත ගුවන් යානාය.

තමන් ජාත්‍යන්තර වශයෙන් ස්වාධීන රාජ්‍යයන් වන බැවින් තවත් රාජ්‍යයකට එරෙහිව තම රටේ භූමිය යොදා ගැනීමට ඉඩ දිය නොහැකි බව ඊට හේතු දක්වමින් ඉන්දුනීසියානු රජය විසින් ප්‍රකාශ කර තිබේ.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2020 ඔක්තෝබර් 22

# ව්‍යවස්ථා සංශෝධන සිදුවිය යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වන දිශාවටයි

(20වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)

**ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම් නායක**
**අනුර දිසානායක සහෝදරයා**

මේ වනවිට 1978 ව්‍යවස්ථාවට සංශෝධන 19ක් ඉදිරිපත් කර තිබෙනවා. එයින් 19 සහ 17 හැර ඉතිරි සංශෝධන 17ටම විරුද්ධ පක්ෂ විරුද්ධ වී තිබෙනවා. 17 සහ 19 සම්මත කරගන්නකොට තිබුණේ සුළුතර ආණ්ඩු. 2001 චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව. 2015 මෛත්‍රී-රනිල් ආණ්ඩුව. 17 සහ 19 වැනි සංශෝධන සුළුතර ආණ්ඩුවකින් ගෙනාවාට ඒවා පාර්ලිමේන්තුවේ වැඩිම අනුමැතියක් ලැබුණ සංශෝධනයි. ඒත් මේ 20වැනි සංශෝධනය සම්මත කර ගන්න යන්නේ තමුන්නාන්සේලා සතු 2/3කේ බලයෙන්.

19වැනි සංශෝධනයේ අඩුපාඩුකම් තිබෙන බව අපි කවුරුත් පිළිගන්නවා. එහි හරය ගැබ්ව තිබුණේ අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යූහයන් සහ ප්‍රජාතන්ත්‍රවාදී තන්ත්‍රය ශක්තිමත් කර ගන්න. ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක් එම තනතුරට නොගැලෙන ආකාරයෙන් කටයුතු කළොත් ඉවත් කරන්න ආකාරයක් නැති බව ආණ්ඩුවෙන් මේ සභාවේදී කිවුවා. නමුත් කරුණු කිහිපයක් 38-8 වගන්තිය යටතේ දීලා තිබෙනවා. ඒ කරුණු ප්‍රමාණවත් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදයේ දිශාවට අන්න ඒ කරුණු ශක්තිමත් කළ යුතුයි. එහෙම නොකර ව්‍යවස්ථා සභාව අවලංගු කිරීමට නීති සම්පාදනය කිරීම තමන් සතු බුද්ධිය අනාචාරයේ යෙදවීමක්.

19වැනි සංශෝධනය පරීක්ෂාවට ලක්කළේ අසාර්ථකම නායකයින් දෙදෙනෙක් යටතේයි. ඒ නිසා 19 වැනි සංශෝධනයට බැට දීම ඒ තරම් යුක්තිසහගත නැහැ. මේ රටේ සියලු අර්බුද නිර්මාණය කර තිබෙන්නේ 19 හේතුකොටගෙන වගේ අදහසක් අධිකරණ ඇමතිතුමා ඊයේ ප්‍රකාශ කළා. කුඩු වැඩිවී තිබීම, ණය වැඩිවී තිබීම, අපරාධ වැඩිවී තිබීම වැනි දේ. ඒත් 1978 සිට 2010 දක්වා අවුරුදු 37ක් විධායක ජනාධිපති ධුරය ශක්තිමත්ව ක්‍රියාත්මක වුණා. මේ අවුරුදු 37 තමයි ලංකාවට කුඩු වසංගතය ආවේ. අපරාධ සංස්කෘතියක් නිර්මාණය වුණේ. රටේ මූල්‍ය අපරාධ ඉහළ ගියේ මේ අවුරුදු 37 තුළ. මේ අර්බුදවල උල්පත ව්‍යවස්ථාව බව අපි කිසිසේත් පිළිගන්නේ නැහැ. ව්‍යවස්ථාව නිර්මාණය වෙන්නේ අර්බුදයන්ට අනුරූපිව මිස ව්‍යවස්ථාව විසින් අර්බුදය නිර්මාණය කළ එකක් නෙවෙයි. ව්‍යවස්ථාව කියන ලේඛනයට තඩිබෑම වැරදියි.

මා උදාහරණයක් හැටියට ගත්තොත් 1977 මැතිවරණයෙන් ආණ්ඩුවට 5/6ක විශේෂිතම බහුතර බලය ලැබුණා. හැබැයි ඔවුන් අපේක්ෂා කළ විනාශකාරී ආර්ථික ගමන ඒ බලයෙන් දියත් කරන්න බැහැ. පාර්ලිමේන්තුවට කේන්ද්‍රවී තිබෙන බලය තනි අතකට ගන්න ඕනෑ වුණා. එදා තිබුණු අර්බුදයට ඔවුන් විසඳුම් සෙවූ දිශානතියෙන් තමයි විධායක බලය නිර්මාණය කළේ. 80 ජූලි වැඩ වර්ජකයින් එළියට දාන්න ජේ.ආර්.ට ඒ බලය ඕනෑ වුණා. 5/6න් බලය තව අවුරුදු 06ක් තියාගන්න ඡන්ද කල් දැම්මා. විනාශකාරී ගමන යන්න 5/6න් බලය තියාගන්න ඕනෑ වුණා. ඒ විනාශකාරී ගමන යන්න විධායක බලය නිර්මාණය කරනවාට ප්‍රගතිශීලි ව්‍යාපාර විරුද්ධ වුණා.

ඒ විනාශයේ උල්පත ව්‍යවස්ථාව නෙවෙයි. අනුගමනය කර සැලසුම් කර තිබුණු ආර්ථික ක්‍රියාමාර්ග. සමානුපාතික මැතිවරණ ක්‍රමය හඳුන්වා දුන්නට පසුව පාර්ලිමේන්තුවේ තනි පක්ෂයකට මන්ත්‍රී ධුර 145ක බලයක් තිබෙනවා. සහයෝගය දෙන අනෙක් කණ්ඩායමත් සමග 150 ඉක්මවූ බලයක් තිබෙනවා. ජනාධිපති ධුරයේ බලයත් තිබෙනවා. ඒ නිසා බලයේ අඩුවක් නැහැ. පළාත් පාලන ආයතනවල බලයත් තිබෙනවා. හැබැයි තනි කෙනෙක් අත බලය නැහැ. එතනයි ඔවුන්ට තිබෙන අඩුව. ඒ බලය ආයතන තුළ පමණක් නෙවෙයි පවුලක් වටාත් කේන්ද්‍රගත වී තිබෙනවා. ජනාධිපතිගේ සොහොයුරු අගමැතිවරයායි. පුතණුවන් ක්‍රීඩා අමාත්‍යවරයා. වැඩිමහල් සහෝදරයා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා. ඔහුගේ ඥාති පුතා රාජ්‍ය අමාත්‍යවරයෙක්. අනෙක් ඥාති පුතා මාතර දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරයා. පාර්ලිමේන්තුවේ නැතත් බැසිල් රාජපක්ෂ සොයුරා බලවත් කාර්යභාරයක් කරනවා. මේ තියෙන්නෙත් බලයක්. හැබැයි ඒකත් මදිවෙලා. හැබැයි ඇයි තවත් මදිවෙන්නේ. ආණ්ඩුවේත් ඥාති සමූහයත් අත බලය කේන්ද්‍රගත වුණාට ඉදිරි සැලසුම්වලට බාධාවක්.



මා කියන්නේ ඉදිරි ආර්ථික පිම්ම යන්න, එම්සීසී අත්සන් කරන්න, කොළඹ ආශ්‍රිත ස්ථාන 05ක හඳුනාගෙන තිබෙන හෙක්ටයාර් 100කට වැඩි ඉඩම් ටික විකුණන්න තනි අතකට මේ බලය ගන්න ඕනෑ. මේකට කාලයක් තිස්සේ උත්සහ කළා. ජේ.ආර්. ජයවර්ධනගේ දෙවැනි පිම්ම ආරම්භ කරන්න රනිල් වික්‍රමසිංහ එවකට අගමැතිවරයා 2002දී උත්සහ කළා. නමුත් බැරි වුණා. ඒ ඉදිරි පිම්ම ගෙනියන්න මේ බලය කේන්ද්‍රගත කරගන්නවා. අපි දේශපාලන ව්‍යාපාරයක් හැටියට ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතභාවය පිළිගන්නවා. පාර්ලිමේන්තුවට කැබිනට් මණ්ඩලයට අධිකරණයට බලය යම් කොටසක් මධ්‍යගත වෙන්න ඕනෑ. හැබැයි අපි අත්තනෝමතික මධ්‍යගතභාවයට පක්ෂපාතී නැහැ. රජුගේ නීතිය ක්‍රියාත්මක වූ රාජාණ්ඩුවල නීතිය රජුගේ. නීතිය ක්‍රියාත්මක කරන්නෙත් රජුයි. ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන්ට බලය පැවරීම කාගේ හෝ ඔළුවකට ආපු සිතුවිල්ලක ප්‍රතිඵලයක් නෙවෙයි. අරගල විසින් දිනාගෙන තිබෙන දෙයක් එදා 1889දී ප්‍රංශයේ ලුවී අත තිබූ බලය ජනතාව පාරට බැහැලා විමධ්‍යගත කළා. මෙතන මධ්‍යගත කරන්න හදන්නේ තනි පුද්ගලයෙකුට.

ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරු සහ විනිසුරුවරුන්, අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු සහ සාමාජිකයින් පත්කිරීමත් ජනාධිපතිවරයා අතට ගන්නවා. ඒක තමයි තනි බලය. අධිකරණ සේවා කොමිසන් සභාවට පහළ අධිකරණවල පත්කිරීම්වලට තිබුණ බලය මේකෙන් අහෝසි වෙනවා. මහේත්‍රාත්වරු බඳවාගැනීම්, දිසා විනිසුරුවරුන් දක්වා උසස්කිරීම් සියල්ල තනි බලයකට ගන්නවා. ඊළඟට පාර්ලිමේන්තුව සතු බලය ව්‍යවස්ථා සභාව මගින් ක්‍රියාත්මක කළා. ඒ ව්‍යවස්ථා සභාව වෙනුවට තේරුමක් නැති පාර්ලිමේන්තු සභාවක් පත් කරනවා. මේ මගින් අත් උස්සලා ව්‍යවස්ථා සභාව සතු බලය ජනාධිපතිවරයාට පවරා දෙනවා. පාර්ලිමේන්තුවේ බහුතරය දිනාගෙන අග්‍රාමාත්‍යවරයා නිර්මාණය වෙනවා. ඊළඟට ඇමතිවරුන්. පාර්ලිමේන්තුවේ කවර මන්ත්‍රීවරුන්ට ඇමති ධුර ලබාදිය යුත්තේ කියලා තීරණය කිරීමේ බලයක් අගමැතිවරයාට තිබෙනවා. ඒකත් ඉවත් වෙනවා. තමන්ගේ අමාත්‍ය ධුරයේ මදය ගලවලා ජනාධිපතිවරයාට ලබාදෙන්න ක්‍රියාකරන්න එපා. අධිකරණයත් පාර්ලිමේන්තුවත් යටපත් කිරීමේ නීති සම්පාදනය කිරීමේ බලය ජනාධිපතිවරයාට ගන්නවා.

අපේ රටේ රාජ්‍ය සේවයට ඇතුළත් නොවන්නේ කවුද කියලා පැවති ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. හැබැයි දැන් තමුන්නාන්සේලා ජනාධිපති කාර්යමණ්ඩලය රාජ්‍ය සේවයට ඇතුළත් නොවෙන අය ලෙස නම් කරනවා. ජනාධිපතිවරයාගේ කාර්යමණ්ඩලය රාජ්‍ය සේවයෙන් ඉවත් කරන ලැයිස්තුවට දැම්මේ ඇයි? ඒක දේශපාලන පක්ෂ ශාඛාවක් කරන්නේ ඇයි? හැබැයි පඩි ගෙවන්නෙ රජයෙන්. ඊට ඉඩ දිය යුතුද? ජනාධිපතිවරයා යටතට විශාල මුදල් පංගුවක් වෙන්කරගෙන තිබෙනවා. එහෙම කැත හිතක් ඇයි? ඊළඟ වැදගත්ම කරුණ රාජ්‍ය සේවයේ ඉහළ තනතුරුවලට පත්කිරීමේ බලයයි. අමාත්‍යංශයකට ලේකම්වරයෙකු පත්කිරීමේ බලය ජනාධිපතිවරයාට තිබෙනවා. ඊට නිර්නායක නැහැ. හැබැයි අමාත්‍යංශයකට ලේකම්වරයා ලෙස පත්කරන තැනැත්තෙකුගේ ධුර දැරීම නතර වුවහොත් එම තැනැත්තා රාජ්‍ය සේවයට පත්කිරීමේ බලය ජනාධිපතිවරයාට ලැබෙනවා. උදාහරණයක් ලෙස කෘෂිකර්ම දේපාර්තිමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පත්කිරීමේ බලය අනුපිළිවෙළට එන්නේ ජ්‍යෙෂ්ඨම නි. කොමසාරිස්වරයාට හෝ නි. අධ්‍යක්ෂ ජනරාල්වරයාට. නමුත් පිටින් අමාත්‍යංශ ලේකම්වරයෙකු ලෙස පත් කර සේවය නතර වුණ කෙනෙක් මේ ඉහළ තනතුරුවලට පත්කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා හැටියට ජනාධිපති විසින් ලබාගෙන තිබෙනවා.

ඊළඟ වැදගත් දේ අගවිනිසුරුවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ විනිසුරුවන් අධිකරණ සේවා කොමිසන් සභාවේ සභාපතිවරයා සහ අනෙකුත් සාමාජිකයින් නීතිපතිවරයා, විගණකාධිපතිවරයා, පොලිස්පතිවරයා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා සහ පාර්ලිමේන්තු මහ ලේකම්වරයා හැටියට වැඩ බැලීමේ පත්කිරීම් කරන්න පුළුවන් සති දෙකකට. සති දෙකකට පසුව ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ගත යුතුයි. මේ වැදගත් තනතුරු පුරප්පාඩු වී නොතිබිය යුතුයි කියන ස්ථාවරයේ ඉඳලයි මේ වගන්තිය ඇතුලත් කර තිබෙන්නේ. මේ අනුව ගත්තොත් දැන් ඉන්න පොලිස්පතිවරයා ව්‍යවස්ථා විරෝධීයි. වැඩබලන තනතුරු මගින් අපේ රාජ්‍ය සේවයේ යාන්ත්‍රණය ජනාධිපතිවරයා අතට ගන්න එක වළක්වන ප්‍රතිපාදන පවතින ව්‍යවස්ථාව තුළ තිබෙනවා. දැන් අහෝසි කරන්න යන්නේ ඒක. ඒ අනුව ඕනෑම කාලයක් වැඩබලන තනතුරක තබාගන්න පුළුවන්.

විගණනය පිළිබඳ ප්‍රශ්නය ව්‍යවස්ථාවෙන් අයින් කළාට පනතේ තිබෙන බව ජීඑල් ඇමතිවරයා කිවුවා. නමුත් විගණන සේවා කොමිසන් සභාව පිහිටුවා විගණනයට බඳවාගැනීම්, සහ මාරු කිරීම් ඒ කාර්යයේ ස්වාධීනත්වය හැටියට පවත්වාගෙන යන්න ඉඩ ලබාදී තිබුණා. ඒ තුළ මූල්‍ය ස්වාධීනත්වය විගණන සේවා කොමිසමට තිබුණා. දැන් ඒකත් ඉවත් කරලා. ඇමතිවරුන්ගේ සීමාව සම්බන්ධයෙන් රිංගන්න පුළුවන් ගැටයක් මේ තුළ තිබෙනවා. පිල්ලෙයාන්ගේ පක්ෂයත් ඩග්ලස් දේවානන්දාගේ පක්ෂයත් එකතු කර ගත්තාම ජාතික ආණ්ඩුවක් කියලා ඇමති ධුර සීමාවෙන් රිංගා යන්න පුළුවන්. අනෙක් පැත්තෙන් ජාතික ආරක්ෂාවට අදාළ හදිසි පනත් සම්මත කර ගන්න මුවාවෙන් රටට විශාල ඩොලර් හිගයක් තිබෙන බව දක්වලා එම්සීසී ගිවිසුම අත්සන් කරන්නත් පුළුවන්.

> මා කියන්නේ ඉදිරි ආර්ථික පිම්ම යන්න, එම්සීසී අත්සන් කරන්න, කොළඹ ආශ්‍රිත ස්ථාන 05ක හඳුනාගෙන තිබෙන හෙක්ටයාර් 100කට වැඩි ඉඩම් ටික විකුණන්න තනි අතකට මේ බලය ගන්න ඕනෑ. මේකට කාලයක් තිස්සේ උත්සහ කළා. ජේ.ආර්. ජයවර්ධනගේ දෙවැනි පිම්ම ආරම්භ කරන්න රනිල් වික්‍රමසිංහ එවකට අගමැතිවරයා 2002දී උත්සහ කළා. නමුත් බැරි වුණා. ඒ ඉදිරි පිම්ම ගෙනියන්න මේ බලය කේන්ද්‍රගත කරගන්නවා.

## '20' සම්මතයි!...

03 පිටුවෙන්

නියෝජිතයන් පැමිණ යන විට ඊනියා විධායක ජනාධිපතිට සිදුවී තිබෙන්නේ ඔවුන් සිරස නමා පිළිගැනීම හා ඔවුන්ට අනුව වැඩකිරීම පමණි.

එපමණක් නොව පොම්පියෝ ලංකාවට එනවිට ආණ්ඩුවේ ඊනියා අධිරාජ්‍ය විරෝධීන්ද මර නින්දේය. මේ සියලු බොරුකාරයන්ගේ සැබෑව මෙතරම් ඉක්මනින් හෙළිවීම ගැන අප රටක් ලෙස සතුටු විය යුතුය. ගෝඨාභයලා පිළිබඳ ජනතාව තුළ ගොඩනැගූ මහා ප්‍රතිරූප හෙට දිනයේ අයිස් කඳු මෙන් දියවී යනු ඇත. එම ව්‍යාජ ප්‍රතිරූප ගොඩනැගීමට ජනතාවට බොරු කියූවන්ද නිරුවත් වනු ඇත. අවසානයේ ජනතාවට සත්‍ය තේරුම් ගෙන තමන්ගේ ඉරණම සිහිබුද්ධියෙන් යුතුව තම අතට ගැනීමට බලකෙරෙනු ඇත. ඒකාධිපති බලය මගින් අර්බුදයන්ට විසඳුම් සෙවීමට යාම අවසන් වනු ඇත්තේ සියලු බලය අහිමි කරමින්ය. එය කල් ඇතිව තේරුම් ගැනීම ජනතාවගේ ජයග්‍රහණයන් සඳහා ඉතා වැදගත්ය.

## ශ්‍රී ලංකාව කිසිදු යුද...

01 පිටුවෙන්

සෑම පුරවැසියෙකුටම මේ තොරතුරු දැනගැනීමේ අවශ්‍යතාවය තිබෙනවා. එසේ නැතිව ජනතාවගේ ඇස් වසා මෙරට ජාත්‍යන්තර යුද උගුලකට හසු කිරීමේ කිසිදු ගිවිසුමකට ඉඩ නොදිය යුතුයි. බලහත්කාරයෙන් මෙරටට එනකොට රටේ නායකයින්, රටේ නායකයින්ගේ බිරින්දෑවරුන් සහ දරුවන් ඇමරිකානු පුරවැසියන්. අපේ රටේ ස්වාධීනත්වය, ස්වෛරීභාවය අපේක්ෂා කරන්නේ එක්සත් ජනපදයේ පුරවැසිභාවය ගත්තු මේ අයගෙන්දැයි අපි ජනතාවගෙන් අහනවා. ඔවුන් වෙනුවෙන් ව්‍යවස්ථාවත් වෙනස් කරනවා. ඕනෑම මොහොතක එක්සත් ජනපදයට පලා යන්න ඉන්න අය 2015දී අපි දැක්කා. තමන්ගේ සෑදෑ සමය එක්සත් ජනපදයේ ගත කරන්න බලාගෙන ඉන්න අයට මේ රටේ ස්වාධීනත්වය හෝ ස්වෛරීභාවය ගැන කිසිදු හැඟීමක් නැහැ. මේ රටේ දේශප්‍රේමීත්වය පිළිබඳ අරගලය රට වෙනුවෙන් සැබෑ ලෙසම බැඳී සිටින අය අතට ගත යුතු බවට ආරාධනය කරනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com










ඓතිහාසික චේ දිනය වෙනුවෙන්..




ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලව සැමරුම...



කොවිඩ් වසංගතය හමුවේ කම්කරු අයිතීන් වෙනුවෙන්...

## පොම්පියෝ ලංකාවට!

එක්සත් ජනපදයට යටවී MCC ඇතුළු රට පාවාදීමේ ගිවිසුම් අත්සන් නොකරනු!

ලෝක බලවතුනට ලංකාව බිලිදෙන ආණ්ඩුවේ විදෙස් ගැති ප්‍රතිපත්තිය හෙළාදකිමු!

ජනතා විමුක්ති පෙරමුණ

# ණය මත යැපෙන ආර්ථිකය වෙනස් නොකර රටට ඉදිරි ගමනක් නැහැ

**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**

කුඩා රටක් වුවද ශ්‍රී ලංකාව ලෝකය සමග ගනුදෙනු කළ යුත්තේ ස්වාධීන, ස්වෛරී රාජ්‍යයක් ලෙස බවත් ඕනෑම රටක් සමග සමාන තත්වයේ අයිතියක් ලංකාවටද ඇති නමුත් ලංකාවට මෙලෙස බලවත් රටවලට යටවීමට සිදුව ඇත්තේ රට බරපතල ණය අර්බුදයකට හෙළා තිබෙන නිසා බවත් පැවසූ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ණය මත ජීවත්වන ආර්ථිකය වෙනස් කිරීමකින් තොරව රටට ඉදිරි ගමනක් නොමැති බවත් ප්‍රකාශ කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේ පැවසුවේ පසුගිය 18වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. මෙහිදී තවදුරටත් අදහස් පළ කළ ඔහු මෙසේද කියා සිටියේය.

"තමන්ට අයිති ඉඩමක් බලන්න එනවා වගේ ලෝක බලවතුන් ලංකාවට එනවා. ඒ නිසා ඔවුන් හිතු හිතු වෙලාවට ඇවිල්ලා ලංකාවේ ස්වාධීනත්වය, ස්වෛරීත්වය සම්බන්ධයෙන් බලපෑම් කරනවා. මෙයට හේතුව ආණ්ඩු අනුගමනය කරමින් තිබෙන විදේශ ප්‍රතිපත්තිය සහ නව ලිබරල් ධනවාදී ආර්ථික දේශපාලන ප්‍රතිපත්තියයි. ඒ අනුව ආණ්ඩුවට තව තවත් ණය ගන්න හෝ සම්පත් විකුණා දමන්න සිදු වෙනවා. පහුගිය ආණ්ඩුත් මේ ආණ්ඩුවත් අනුගමනය කරන ණයට කන ආර්ථිකය විසින් මේ හැම රටකම අතවැසියෙක් බවට ලංකාව පත්කර තිබෙනවා. ඇත්තටම ගත්තොත් අපේ රටට මේ එන්නේ ණය හිමියන්. ණය හිමියා එනකොට ණයගැතියා දෙකට නැමිලා ඉන්න ඕනෑ තමයි. අපේ රට රුපියල් ට්‍රිලියන 13කට වැඩි ණය කන්දරාවක රට හිරවෙලා. මේ ණය ප්‍රමාණය වැඩිවීම නිසා මූඩිස් ආයතනය විසින් ලංකාව ණය දීමේ හැකියාව අඩුම රටක් හැටියට පහත හෙළුවා. තව ඒකකයක් පහත දැම්මොත් කිසිම රටකින් ණය ගන්න ලැබෙන්නේ නැහැ.

නව ලිබරල්වාදය වැළඳගත්ත ආණ්ඩුව රට ණය උගුලක ගිල්වීමෙන් අවසන් නොවී ලංකාව කලාපීය ආර්ථික



සහ දේශපාලන බලවතුන්ගේ ගොදුරක් බවට පත්කර තිබෙනවා. තම තමන්ගේ වෙළඳපොළ වෙනුවෙන්, දේශපාලන බලය වෙනුවෙන් ගහගන්න කොට එහි මර්මස්ථානය බවට පත්වෙන්නේ අපේ රටයි. ආණ්ඩුවේ සුරංගනා කතාවලට නොරැවටී අපේ රටට තිබෙන ඇත්ත අනතුර පිළිබඳව අවදියෙන් සිට එය පරාජය කරන්න මැදිහත් වෙන්න කියලා අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා."

# අවදානම අතහැර සිටි ආණ්ඩුව කොවිඩ් ව්‍යාප්තියේ වගකීම භාරගත යුතුයි

**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**

පසුගිය කාලය පුරාම ආණ්ඩුව කොරෝනා අවදානම සම්පූර්ණයෙන්ම පහව ගොස් ඇති බව ජනතාවට හැඟී යන ආකාරයට කටයුතු කළ බවට චෝදනා කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, සැබැවින්ම අවදානම සම්පූර්ණයෙන්ම පහව ගොස් නොතිබූ නමුදු ආණ්ඩුව කොරෝනා පාලන කටයුතු සම්පූර්ණයෙන්ම අත්හැර තිබූ බවත් කොරෝනා දෙවන රැල්ල මතුවුණේ ඒ තත්වය නිසා බවත් පෙන්වා දුන්නේය.

විජිත හේරත් සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 13වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද කියා සිටියේය.

"මාධ්‍ය මගින් පවා නිතර ප්‍රචාරය කළේ ලෝකයේ කොරෝනා මර්දනය කළ දෙවන රට බවට ලංකාව පත්වී ඇති බව. මේ නිසා කොරෝනා මර්දන බලකායේ ප්‍රධානියා පවා පස්සෙදි කීවේ සියලු අංශ අධි තක්සේරුවක සිටිය බව. දින කිහිපයකට කලින් ලෝකයේ දෙවැනි තැනට කොරෝනා මර්දනය කළ රට හැටියට පුරාජේරු ගැහුවට ඒ තුළම දෙවැනි රැල්ලත් ආවා. පාලනය කළා යැයි උදම් ඇනීම අධිතක්සේරුවක් බව ඒ මගින් ඔප්පු වුණා. තත්වය දැන් පෙරටත් වඩා භයානකයි.

හෙට දවසේ පොකුරක් මතුවෙන්න පුළුවන්. ආණ්ඩුව මේ සම්බන්ධයෙන් විධිමත් ආකාරයට කරුණු සොයා බලා ජනතාවගේ ආරක්ෂාව තහවුරු කළ යුතුව තිබෙනවා. කල් නොයවා ඉක්මනින්ම එය කළ යුතුයි. හෙට අනතුර වළක්වා ගන්න නම් වර්තමාන රැල්ල ඇතිවුණේ කොහොමද කියලා රටට පැහැදිලි කරන ලෙස අපි අවධාරණය කරනවා. මුල් අවස්ථාවේදී ජංගම දුරකතන මගින් සෞඛ්‍යාරක්ෂක ක්‍රම ගැන කරුණු පැහැදිලි කිරීමේ රිගිං ටෝන් පවා තිබුණා. පස්සෙදී ඒවා නතර කළා. කොරෝනා මර්දන බලකාය



නිවැරදිව රැස්විය යුතුව තිබුණත් එය ඒ ආකාරයෙන්ම රැස් නොවූ බවට වාර්තා පළ වෙනවා. ක්ෂණික මැදිහත් වීම් ගණනාවක් අඩපණ වන නිසා පීසීආර් පරීක්ෂණ ප්‍රතිඵල ඉක්මනින් ලබාදිය යුතුයි. එසේම ආණ්ඩුව මැදිහත් වී මේ තත්වය තුළ පීඩනයට පත්වූවන්ට සහන සැලසීමට වහාම ඉදිරිපත්විය යුතු බව අපි අවධාරණය කරනවා.

# පොම්පියෝගේ යෝජනා මොනවාදැයි රටට හෙළිකරන්න

**ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා**



ඇමරිකානු ජනාධිපතිවරණය නොවැම්බර් 03වැනිදාට යෙදී තිබියෙදී එ.ජ. රාජ්‍ය ලේකම් මයික් පොම්පියෝ ඔක්තෝබර් 28වැනිදා හදිසියේ ලංකාවට පැමිණෙන බව කී ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා, එ.ජ. ජනාධිපතිවරණයට දින 05ක් තිබියෙදී ඇමරිකානු අධිරාජ්‍යයේ යුද සහ දේශපාලන පණිවුඩ ලෝකයට ගෙනයන පණිවුඩකරුවා ලංකාවට පැමිණෙන්නේ කුමක් නිසාදැයි ආණ්ඩුව රටට කිව යුතුව ඇතැයි ප්‍රකාශ කර සිටියේය.

බිමල් රත්නායක සහෝදරයා මේ අදහස් පළ කළේ රටට එල්ල වෙමින් ඇති විදෙස් බලපෑම් පිළිබඳව පසුගිය 25වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කරමින් ඔහු මෙසේද පැවසීය.

ශ්‍රී ලංකාව අද සිරවී තිබෙන ණය උගුල, ජනාධිපතිවරයාට හා ඇමතිවරුන්ට තිබෙන ඇමරිකානු සම්බන්ධතා සහ තවත් කරුණු මත ලංකාව බ්ලැක්මේල් කරනවාද කියන කරුණුවලට පිළිතුරු ආණ්ඩුව ලබා දිය යුතුයි. අපි ජනතා විමුක්ති පෙරමුණ හැටියට අවධාරණය කරන්නේ චීන, අමරිකානු, ඉන්දියානු දේශපාලන උගුලක අපේ රට පටලවා තිබෙන බවයි. පසුගිය අවුරුදු 10-15 තුළ සිටි සියලුම පාලකයන් විසින් ආර්ථික සහ දේශපාලන උගුල්වල පටලවා තිබෙන රට පොම්පියෝගේ මැදිහත්වීමෙන් යුද උගුලක පැටලවීම දක්වා ගෙන යන්න හදනවාද කියන ප්‍රශ්නය බරපතළව අපි නගනවා. ආණ්ඩුවේ බොරු දේශප්‍රේමී ප්‍රචාරවලට රැවටී ඡන්දය දුන් පිරිසට සහ නොදුන් සියලු දෙනාටම රටේ ස්වෛරීත්වය ආරක්ෂා කර ගැනීමේ වගකීමක් තිබෙනවා. ඒ නිසා දූෂිත, ද්විත්ව පුරවැසිභාවය තිබෙන ඒකාධිපති පාලකයන් හැම විටම බලගතු රාජ්‍යවල සුරතලුන් බවට පත්වෙනවා. අපේ රටේ එම තත්වය බරපතළ ලෙස වර්ධනය වෙමින් තිබෙනවා. එයින් රට මුදා ගන්නේ කොහොමද කියන එක ජනතාවත් කල්පනා කළ යුතු බව අවධාරණය කරනවා."


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.